# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,687 - 2010 දෙසැම්බර් මස 31 වැනි සිකුරාදා - 2010.12.31

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (IIආ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් .... ... ... | 2420 |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | 2420 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | — |
| රජයේ නොවන දැන්වීම් ... ... ... | 2421 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 2425 |
| විවිධ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2011 ජනවාරි මස 07 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2010 දෙසැම්බර් මස 24 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2010 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

**අධිකරණ අමාත්‍යාංශ ලේකම්ගේ ආ. 12/වාහන වෙන්දේසි (3) 2003 සහ 2003.12.10 දිනැති චක්‍රලේඛය අනුව**

මාවනැල්ල මහෙස්ත්‍රාත් අධිකරණයේ රාජසන්තක කරන ලද පහත විස්තර සඳහන් වාහන විකිණීම සඳහා තබන ලද ටෙන්ඩර් මිල ගණන් 2011ක් වූ පෙබරවාරි මස 01 වැනි දින පෙ. ව. 10.00 සිට 2011 පෙබරවාරි මස 18 වැනි දින ප. ව. 2.30 දක්වා කෑගල්ල මහාධිකරණයේ දී භාරගනු ලැබේ.

ටෙන්ඩර් පත්‍ර මහාධිකරණ විනිසුරු මහාධිකරණය, කෑගල්ල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් භාරදිය යුතු ය. ලියාපදිංචි තැපෑලෙන් ටෙන්ඩර් පත්‍ර එවීමේ දී ලිපි කවරයේ වම් පස ඉහළ කෙළවරේ 'වාහන සඳහා ටෙන්ඩර්' යනුවෙන් සඳහන් කළ යුතු ය.

*අදාළ විස්තරය :*

1. මාව/මහේ/අංක : 19361 දරන නඩුවට අයත්, IMT 533, යුගෝස්ලෝවියාවේ නිෂ්පාදිත අංක 36 ශ්‍රී 2382 දරන ට්‍රැක්ටරය සහ අංක 46 - 3597 දරන එම ට්‍රැක්ටර් ටේලරය.

2. මාව/මහේ/අංක : 98674 දරන නඩුවට අයත්, අංක SG JU 6976 දරන 2. ස්ට්‍රොක් බජාජ් වර්ගයේ රතු පැහැති ත්‍රීරෝද රථය.

(1) ටෙන්ඩර් භාරගැනීම අවසන් වූ වහාම ටෙන්ඩර් විවෘත කර අනුමැතිය සඳහා මහාධිකරණයේ ටෙන්ඩර් මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබේ.

(2) ටෙන්ඩර් මණ්ඩලයේ අනුමැතියෙන් පසු 2011 ක් වූ පෙබරවාරි මස 23 වැනි දින ප. ව. 2.00 ට වැඩිම ඉල්ලුම්කරුට එම වාහන විකුණනු ලබන බැවින් ටෙන්ඩර්කරු හෝ ඔහුගේ බලයලත් නියෝජිතයෙකු අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා පිළිගත් හැඳුනුම්පතක් ද රැගෙන නියමිත වේලාවට පැමිණ සිටිය යුතු ය.

(3) කිසියම් ටෙන්ඩර්කරුවෙකු විසින් විධිමත් පරිදි ටෙන්ඩර් ඉදිරිපත් කර, යම් හෙයකින් ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේ දී ටෙන්ඩර් කරු හෝ ඔහුගේ බලයලත් නියෝජිතයෙකු පැමිණ නොසිටියහොත් එම ටෙන්ඩරය අවලංගු වනු ඇත.

(4) ඉහත සඳහන් පරිදි වාහන සඳහා ඉල්ලුම්පත්‍ර ගාස්තු වශයෙන් ආපසු නොගෙවන රුපියල් 100 ක ටෙන්ඩර් ගාස්තුවක් සහ ආපසු ගෙවන රු. 1,000 ක ඇප තැන්පත් මුදලක් කෑගල්ල මහාධිකරණයේ රෙජිස්ට්‍රාර් වෙත ගෙවා ආකෘති පත්‍ර ලබාගත යුතු ය.

කේ. එච්. සුමිත්‍රපාල,<br>
මාහධිකරණ විනිසුරු,<br>
මහාධිකරණය,<br>
කෑගල්ල.

2010 දෙසැම්බර් මස 06 වැනි දින,<br>
කෑගල්ල මහාධිකරණයේ දී ය.

12-895

---

# බඩු බාහිරාදිය විකිණීම

**දිසා හා මහෙස්ත්‍රාත් අධිකරණය - වලස්මුල්ල**

වලස්මුල්ල දිසා හා මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාළ රාජසන්තක කරන ලද හා මෙතෙක් හිමිකම් නොකියන ලද පහත විස්තර සඳහන් භාණ්ඩ 2011.01.08 වැනි දින පෙ.ව. 10.00 ට වලස්මුල්ල දිසා හා මහෙස්ත්‍රාත් අධිකරණ භූමියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ. මෙහි පහත සඳහන් හිමිකම් නොපෑ භාණ්ඩ සම්බන්ධයෙන් හිමිකම් කියන අයෙකු වෙතොත් වෙන්දේසිය ආරම්භ කිරීමට ප්‍රථම තම හිමිකම් අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය මත එදින පෙ.ව. 8.30 සිට පෙ.ව. 9.30 දක්වා කාලය තුළ භාණ්ඩ පරීක්ෂා කර බැලීමට ඉඩ දෙනු ලැබේ.

අධිකරණය මගින් නියම කරනු ලබන අවම ලංසුව නොපිළිගැනෙන අවස්ථාවල දී අධිකරණයේ අභිමතය පරිදි එම ද්‍රව්‍ය වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමට අයිතිය ඇත.

වෙන්දේසියේ මිලදී ගනු ලබන භාණ්ඩ සඳහා එවෙලේම මුදල් ගෙවිය යුතු අතර, චෙක්පත් හෝ මුදල් ඇණවුම් භාරගනු නොලැබේ.

වෙන්දේසියෙන් මිලදී ගනු ලබන භාණ්ඩයන් එදිනම ප.ව. 5.00 ට පෙර අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය.

චන්දිම ලියනගේ,<br>
දිසා විනිසුරු/මහෙස්ත්‍රාත්

2010 ක් වූ දෙසැම්බර් මස 02 වැනි දින,<br>
වලස්මුල්ල, දිසා හා මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

| | | |
|---|---|---|
| 1. | AR/617/02 | අංක 109-7564 දරන හොණ්ඩා යතුරුපැදිය |
| 2. | AR/61/02 | අංක 123-7785 දරන යතුරු පැදිය |
| 3. | AR/361/02 | අංක 118-4267 දරන යමහා යතුරුපැදිය |
| 4. | AR/428/04 | චැසි අංක 1401587 දරන හොණ්ඩා ලි.ප. අංක රහිත යතුරු පැදිය |
| 5. | 9135 | අංක 78 - 6612 දරන අත්ට්‍රැක්ටරය |
| 6. | 10880 | සීපෑන් වර්ගයේ අත්ට්‍රැක්ටරය |
| 7. | 6333 | සීපෑන් වර්ගයේ අත්ට්‍රැක්ටරය |
| 8. | 89386 | sp GZ4458 දරන අත්ට්‍රැක්ටරය |
| 9. | 99405 | සීපෑන් වර්ගයේ අත්ට්‍රැක්ටරය |
| 10. | 91955 | අංක 201-4420 දරන ත්‍රීරෝද රථය |
| 11. | 79808 | අංක 135-7092 දරන යතුරු පැදිය |
| 12. | 96968 | Sp HH 3899 දරන යතුරු පැදිය |
| 13. | 9122 | Sp JN 3599 ඇංගාටෙක් අත් ට්‍රැක්ටරය |
| 14. | 3687 | රවුම් කියත සහිත ඉරුම් මේසය |
| 15. | 8481 | රවුම් කියත සහිත ඉරුම් මේසය (යකඩ රාමුව) |
| 16. | 9135 | රවුම් කියත සහිත ඉරුම් මේසය |
| 17. | 9135 | රවුම් කියත සහිත ඉරුම් මේසය |
| 18. | 10880 | රවුම් කියත සහිත ඉරුම් මේසය |
| 19. | 6029 | රවුම් කියත සහිත ඉරුම් මේසය |
| 20. | 4807 | රවුම් කියත සහිත ඉරුම් මේසය (යකඩ රාමුව) |
| 21. | 6480 | රවුම් කියත සහිත ඉරුම් මේසය |
| 22. | 96941 | රවුම් කියත සහිත ඉරුම් මේසය |
| 23. | 97097 | රවුම් කියත සහිත ඉරුම් මේසය (දිරාපත්) |
| 24. | 97458 | රවුම් කියත සහිත ඉරුම් මේසය (දිරාපත්) |
| 25. | 1684 | රවුම් කියත සහිත ඉරුම් මේසය |

| | | |
|---|---|---|
| 26. | 412 | රවුම් කියත සහිත ඉරුම් මේසය |
| 27. | 96149 | රවුම් කියත පමණි |
| 28. | 92001 | රවුම් කියත සහිත ඉරුම් මේසය (යකඩ රාමුව) |
| 29. | 97004 | රවුම් කියත සහිත ඉරුම් මේසය |
| 30. | 97518 | රවුම් කියත සහිත ඉරුම් මේසය |
| 31. | 97552 | රවුම් කියත සහිත ඉරුම් මේසය |
| 32. | 97645 | රවුම් කියත සහිත ඉරුම් මේසය |
| 33. | 97899 | රවුම් කියත සහිත ඉරුම් මේසය |
| 34. | 5682 | රවුම් කියත සහිත ඉරුම් මේසය |
| 35. | 90753 | රවුම් කියත පමණි |
| 36. | 80378 | කියත් 01 |
| 37. | 55530 | බන්ඩ් කියත් 01 |
| 38. | 68140 | බන්ඩ් කියත් 03 |
| 39. | 63157 | කියත් 01 |
| 40. | 92034 | බන්ඩ් කියත් 01 |
| 41. | 73407 | මහ කියත් 01 |
| 42. | 66973 | බන්ඩ් කියත් 01 |
| 43. | 67184 | බන්ඩ් කියත් 01 |
| 44. | 66729 | ඉරුම් කියත් 01 |
| 45. | 75341 | අත් කියත් 01 |
| 46. | 65655 | ඉරුම් කියත් 01 |
| 47. | 66839 | බන්ඩ් කියත් 01 |
| 48. | 65479 | බන්ඩ් කියත් 01 |
| 49. | 63873 | බන්ඩ් කියත් 01 |
| 50. | 71231 | බන්ඩ් කියත් 01 |
| 51. | 72368 | බන්ඩ් කියත් 01 |
| 52. | 74858 | බන්ඩ් කියත් 01 |
| 53. | 66836 | බන්ඩ් කියත් 01 |
| 54. | 62851 | කියත් 01 |
| 55. | 65843 | කියත් 01 |
| 56. | 62137 | කියත් 01 |
| 57. | 64409 | කියත් 01 |
| 58. | 66408 | කියත් 01 |
| 59. | 65700 | කියත් 01 |
| 60. | 65654 | කියත් 01 |
| 61. | 63164 | කියත් 01 |
| 62. | 73091 | බන්ඩ් කියත් 01 |
| 63. | 38724 | බන්ඩ් කියත් 01 |
| 64. | 36258 | කියත් 01 |
| 65. | 54501 | කියත් 01 |
| 66. | AR82/09 | කාන්තා රුලේ පාපැදිය |
| 67. | 10373 | අංක 04052905 දරන වතුර මෝටරය |
| 68. | 6921 | ඇලුමිනියම් කළ 01 |
| 69. | 1594 | ඇලුමිනියම් මුට්ටි 01 |
| 70. | 9385 | බුරුත දැව වලින් තනන ලද දිග පුටු 02, තනි පුටු 04 යි. |
| 71. | 12171 | ස්ටූල් 01, අඩක් නිම කරන ලද පුටු ඇඳි 02 යි |
| 72 | - | හිස් බෝතල් තොගයක් |
| 73 | - | යකඩ බැරල් 150 ක් |

12-640

# රජයේ නොවන දැන්වීම්

## නිවේදනයයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාර ෆියුචර් ඔටෝමොබයිල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් 2010 දෙසැම්බර් මස 06 වැනි දින සංස්ථාගත කරන ලද බවට මෙයින් නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : ෆියුචර් ඔටෝමොබයිල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පි වී 75861
ලියාපදිංචි කාර්යාලය : අංක 14, ද ෆොන්සේකා පෙදෙස, කොළඹ 05.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සෙකට්රීස් ඇන්ඩ් රෙජිස්ට්‍රාර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

අංක 32 ඒ,
පළමුවන මහල,
ශ්‍රීමත් මොහමඩ් මාකන් මාකර් මාවත,
කොළඹ 03.

12-985

## ප්‍රසිද්ධ නිවේදනය

2010 දෙසැම්බර් මස 14 වැනි දින සමාගමේ කොටස් හිමියන් විසින් සම්මත කරගනු ලැබූ විශේෂ යෝජනා සම්මතයක් මගින් 2007 අංක 7 දරන සමාගම් පනතේ 11 (1) වැනි වගන්තියට අනුව මෙම සමාගමේ පෞද්ගලික ආයතනයක් වශයෙන් වූ තත්ත්වය ප්‍රසිද්ධ ආයතනයක් බවට වෙනස්කරන ලද බවත්, ඒ අනුව ආයතනයේ නම බ්‍රවුන්ස් ඉන්වෙස්ට්න්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් වෙනුවට බ්‍රවුන්ස් ඉස්වෙස්ට්මන්ට්ස් ලිමිටඩ් වශයෙන් වෙනස් කරන ලද බවත්, 2008 නොවැම්බර් මස 10 වැනි දින සංස්ථාගත කරන ලද ලියාපදිංචි අංක පී වී 66136 දරන බ්‍රවුන්ස් ඉන්වෙස්ට්මන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2007 අංක 7 දරන සමාගම් පනතේ 11 (5) වැනි වගන්තිය ප්‍රකාරව මෙයින් නිවේදනය කර සිටිනු ලැබේ.

ලේකම්,
ස්ටැන්ඩර්ඩ් ෆිනෑන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.

ලේකම්වරුන්
2010 දෙසැම්බර් මස 15 වැනි දින දී ය.

12-1095

## නිවේදනයයි

වර්ෂ 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්ති ප්‍රකාර පහත සඳහන් සංස්ථාව සංස්ථාපිත කළ බවට මෙයින් දන්වමු.

සමාගමේ නම : එස්. එස්. එස්. හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී. 75527,
ලියාපදිංචි කාර්යාල ලිපිනය : අංක 25/1, ග්‍රීන් පාත්, කොහුවල, නුගේගොඩ
ලියාපදිංචි කළ දිනය : 2010.11.19

සමාගම් ලේකම්වරු,
එම්. ඒ. ආර්. එස්. මුදන්නායක.

12-1093

## නිවැරදි කිරීමයි

### ඇටෝර්නි බලපත්‍රයක් යටතේ දී ඇති බලය අවලංගු කිරීම

2010 නොවැම්බර් මස 12 වැනි දින සාමාන්‍ය ගැසට් පත්‍රයේ I වැනි කොටස (II ආ) වැනි ඡෙදය-පළකිරීම් හි රජයේ නොවන දැන්වීම් යටතේ අංක 11-150 දැන්වීම අවසානයෙහි පහත සඳහන් කොටස ඇතුළත් විය යුතු ය.

රොකී ආරියරත්න,
නීතිඥ.

කොළඹ 05,
ටොරින්ටන් මාවතේ,
අංක 265/N 102 ''

12-1067

---

## සමාගමේ නාමය වෙනස් කිරීමේ ප්‍රසිද්ධ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ 8 (2) වගන්තිය ප්‍රකාරව, පහත සඳහන් සමාගමේ නාමය වෙනස් කොට ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

| | |
|---|---|
| සමාගමේ පැවති නාමය : | සියැට් කැළණි ඇසෝසියේටඩ් හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ් |
| සමාගමේ අංකය : | පී වී 3772 |
| සමාගමේ ලියාපදිංචි කාර්යාල ලිපිනය : | නුංගමුගොඩ, කැළණිය |
| සමාගමේ අලුත් නාමය : | සියැට්කැළණි හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ් |

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

පී. ආර්. සෙක්‍රටේරියල් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
අධ්‍යක්ෂක.

12- 1104

---

## දැන්වීමයි

පහත විස්තර කරන ලද ව්‍යාපාර නම හා අංක දරන සමාගම 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ සංස්ථාගත කරනු ලැබූ සමාගමක් වශයෙන් ලියාපදිංචි කළ ව්‍යාපාරයක් බව දැනුම් දෙමි.

| | |
|---|---|
| 1. සමාගමේ නම : | ඕපන් පාත් අයි ටී (ප්‍රයිවට්) ලිමිටඩ් |
| 2. සංස්ථාගත කළ දිනය : | 2010.11.16 |
| 3. සමාගමේ අංකය : | පී වී. 75506 |
| 4. ලියාපදිංචි ලිපිනය : | අංක 51/9 බී දඹහේන පාර, මහරගම |

ලේකම්,
එකවුන්ට්ං ඇන්ඩ් ඇලයිඩ් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්.

අංක 67 ඒ, ඩේවිඩ්සන් පාර,
කොළඹ 04.

12-1121

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව කරනු ලබන දැන්වීමයි

| | |
|---|---|
| 1. සමාගමේ නම : | වෙදගෙදර හර්බල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් |
| 2. සමාගමේ ලියාපදිංචි අංකය : | පී. වී. 75819 |
| 3. සමාගමේ ලියාපදිංචි කාර්යාලය : | අංක 239/එච්, "නාසානන්ද" මාකේවිට, ජාඇල. |

ඒ. ගුණසේකර,
කළමනාකාර අධ්‍යක්ෂ.

12-1016

---

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීමයි

නුගේගොඩ ශ්‍රී ජයවර්ධනපුර නවරෝහල පාර, 2000 ප්ලාසා නිවාස අංක 610 හි පදිංචි දයානන්ද දිසානායක (ජා. හැ. අංක 441521561 V ) වන මාගේ ඇටර්නි බලකරු ලෙස " සීතා ස්ටෝර්ස්" උඩුගම, ඇඹිලිපිටිය හි පදිංචි සීතා පියසීලි දිසානායක පත්කරමින් ඥානසිරි සමරනායක ඇඹිලිපිටිය ප්‍රසිද්ධ නොතාරිස් තැන විසින් සහතික කරන ලද අංක 342 සහ 1991 අගෝස්තු මස 01 වැනි දින දරන ඇටර්නි බලපත්‍රය මෙයින් අවලංගු කරන බවත් ඒ මත මාගේ ඇටර්නි බලකරු ලෙස පත්කළ සීතා පියසීලි මින් මතුවට මාගේ ඇටෝර්නි බලකරු ලෙස ක්‍රියා නොකරන බවත් මින් මතුවට එකී ඇටර්නි බලපත්‍රය මත අය කරනු ලබන කිසිදු ක්‍රියාවක් මාගේ ක්‍රියාවක් ලෙස නොසලකන බවත් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සියලු දෙනා වෙත මෙයින් දැනුම් දෙමි.

දයානන්ද දිසානායක.

12-1033

---

## දැන්වීමයි

වර්ෂ 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාගත කළ බව මින් දැනුම් දෙමි

| | |
|---|---|
| සමාගමේ නම : | සී. ඩබ්. ඊ. සෙකියුරිටි ඇන්ඩ් ජැනිටෝරියල් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ් |
| ලියාපදිංචි අංකය : | පී. වී. 75821 |
| ලියාපදිංචි කාර්යාලයීය ලිපිනය : | 7 මහල, සතොස මහලේකම් ගොඩනැගිල්ල, අංක 27, වොක්ෂෝල් වීදිය, කොළඹ 02 |
| සංස්ථාගත කළ දිනය : | 2010.12.02 |

පී. එල්. ජයසිංහ,
සමාගම් ලේකම්.

2010 දෙසැම්බර් මස 15 වැනි දින.

12-1030

### ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමජවාදී ජනරජයේ මුන්දලම, අඟුණවිල අංක 149 දරන ලිපිනයේ පදිංචි බණ්ඩාරනායක මුදියන්සෙලාගේ ස්ටෙලා කුමාරිහාමි (ජා. හැ. අංක 496701321 V) වන මම, ගම්පහ දිස්ත්‍රික්කයේ කොච්චිකඩේ, දලුවකොටුවේ ජනපද මාවතේ අංක 565 ඒ යන ලිපිනයේ පදිංචි කරුණානායක මුදියන්සෙලාගේ නයන ධනුෂ්ක බණ්ඩාර කරුණානායක යන අයට පුත්තලම ප්‍රසිද්ධ නොතාරිස් ඒ. එම්. එම්. එස්. අබ්දුල් කාදර් මහතා විසින් ලියා සහතික කළ අංක 20298 හා 2003.09.09 වැනි දින දරන ඇටර්නි බලපත්‍රය මගින් මා වෙනුවෙන් ක්‍රියා කිරීමට දී තිබූ ඇටර්නි බලය අද දින සිට බලපැවැත්වෙන පරිදි අවලංගු කරන අතර එදිනට පසු ඔහු විසින් කරනු ලබන කිසිදු ක්‍රියාවකට මා විසින් වග නොකියන බවත් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි.

බණ්ඩාරනායක මුදියන්සෙලාගේ ස්ටෙලා කුමාරිහාමි.

2010 දෙසැම්බර් මස 06 වැනි දින.

12-955

---

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම 2010 නොවැම්බර් මස 10 වැනි දින සංස්ථාගත කරන ලදී.

| | |
|---|---|
| සමාගමේ නම : | ලංකා එලිගන්ස් (පුද්ගලික) සමාගම |
| සමාගමේ අංකය : | පී. වී. 75403 |
| ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : | අංක 89 බී, 08 වැනි පටුමග, සිද්දමුල්ල, පිළියන්දල |

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

බිස්නස් සොලුෂන්ස් ඇන්ඩ් සෙකට්‍රීස් (පුද්ගලික) සමාගම.

12-883

---

### දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනත

**ක්‍රොස්රෝඩ්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් - පී වී 74722**

ඉහත සඳහන් සමාගම 2010 ඔක්තෝබර් මස 06 වැනි දින සංස්ථාගත කළ බව සහ එහි ලියාපදිංචි කාර්යාලය අංක 235/12, අවිස්සාවේල්ල පාර, ඔරුගොඩවත්ත, වැල්ලම්පිටිය ලිපිනයේ පවත්වාගෙන යන බව 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ මින් දැනුම් දෙමු.

බී. ඩී. ඕ. සෙකට්‍රීස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

අංක 65/2, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත,
කොළඹ 02.
2010 දෙසැම්බර් මස 13 වැනි දින.

12-934

---

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව, පහත සඳහන් සමාගම සංස්ථාගත කොට ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

| | |
|---|---|
| සමාගමේ නාමය : | ස්ප්‍රිංකෙයා හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ් |
| සමාගමේ අංකය : | පී වී 75867 |
| සංස්ථාගත කළ දිනය : | 2010 දෙසැම්බර් මස 06 වැනි දින |
| සමාගමේ ලියාපදිංචි කාර්යාලයීය ලිපිනය : | අංක 19 ඒ, ගවර් වීදිය, කොළඹ 05. |

අධ්‍යක්ෂක.

12-899

---

### මහජනතාව වෙත දැනුම් දීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සීමාසහිත සමාගම 2010 දෙසැම්බර් මස 7 වැනි දා පිහිට වූ බව මෙයින් දන්වා සිටිනු ලැබේ.

| | |
|---|---|
| සමාගමේ නම : | මනේ ඒෂියා (ප්‍රයිවට්)ලිමිටඩ් |
| සමාගමේ අංකය : | පී වී 75878 |
| ලියාපදිංචි කාර්යාලය : | අංක 98 B, එලී හවුස් පාර, කොළඹ 15 |

එස් ජේ කෝපරේට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

04 වැනි මහල, අංක 02,
කාසල් පටුමග,
කොළඹ 04.
2010 දෙසැම්බර් මස 7 වැනි දින.

12-937

---

### මහජනතාව වෙත දැනුම් දීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සීමාසහිත සමාගම 2010 දෙසැම්බර් මස 3 වැනි දා පිහිට වූ බව මෙයින් දන්වා සිටිනු ලැබේ.

| | |
|---|---|
| සමාගමේ නම : | සිලෝන් ඩිස්ට්‍රිබියුෂන් (ප්‍රයිවට්) ලිමිටඩ් |
| සමාගමේ අංකය : | පී වී 75833 |
| ලියාපදිංචි කාර්යාලය : | අංක 100, කින්සි පාර, කොළඹ 07 |

එස් ජේ කෝපරේට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

04 වැනි මහල,
අංක 02,
කාසල් පටුමග,
කොළඹ 04.
12-938

### මහජනතාව වෙත දැනුම් දීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සීමාසහිත සමාගම 2010 දෙසැම්බර් මස 3 වැනි දා පිහිට වූ බව මෙයින් දන්වා සිටිනු ලැබේ.

සමාගමේ නම : ඩවුන් සවුත් (ප්‍රයිවට්)ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 75834
ලියාපදිංචි කාර්යාලය : අංක 100, කින්සි පාර, කොළඹ 07

එස් ජේ කෝපරේට් සර්විසස් (ප්‍රයිවට්) ලිමටඩ්,
සමාගම් ලේකම්වරු.

04 වැනි මහල,
අංක 02,
කාසල් පටුමග,
කොළඹ 04
2010 දෙසැම්බර් මස 3 වැනි දින.

12-939

---

### දැන්වීමයි

2010.09.02 වැනි දින සංස්ථාපනය කරන ලද බව 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාරව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : ගුඩ් වින් ඇඩ්වටයිසින් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 74100
ලියාපදිංචි කාර්යාලය : අංක 73 C, මැනිං පෙදෙස, වැල්ලවත්ත, කොළඹ 06

ආර් සෙන්දිට්කුමරන්,
ලේකම්.

2010 සැප්තැම්බර් මස 08 වැනි දින.

12-954

---

### දැන්වීමයි

ඒ. එම්. පී. සිලෝන් (පුද්ගලික) සමාගම, සිලෝන් නේචර් ප්‍රඩක්ට්ස් (පුද්ගලික) සමාගම, ලංකා ඉන්ටර්නැෂනල් ක්‍රාෆ්ට්ස් (පුද්ගලික) සමාගම සහ ෆර්ස්ට් සිලෝන් පේපර් වර්ක්ස් (පුද්ගලික) සමාගම යන ආයතන ඒකාබද්ධ කිරීම

ඒ. එම්. පී. සිලෝන් (පුද්ගලික) සමාගම, සිලෝන් නේචර් ප්‍රඩක්ට්ස් (පුද්ගලික) සමාගම, ලංකා ඉන්ටර්නැෂනල් ක්‍රාෆ්ට්ස් (පුද්ගලික) සමාගම සහ ෆර්ස්ට් සිලෝන් පේපර් වර්ක්ස් (පුද්ගලික) සමාගම, යන ආයතන ඒකාබද්ධ කිරීම සම්පූර්ණ කොට ඇති බවත්, 2007 අංක 7 දරන සමාගම් පනතේ 244 (1) (a) වගන්තියට අනුකූලව 2010 නොවැම්බර් මස 18 වැනි දින සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් විසින්, එම සමාගම් ඒකාබද්ධ කළ බවට සහතිකයක් නිකුත් කොට ඇති බවත් නිවේදනය කෙරේ.

නව ඒකාබද්ධ සමාගමේ ලියාපදිංචි ලිපිනය : අංක 216 ද සේරම් පෙදෙස, කොළඹ.

සභාපති,
ඒ. එම්. පී. සිලෝන් (පුද්ගලික) සමාගම.

12-884

---

### සමාගම් නාමය වෙනස් කිරීම

ඩයිනා වොෂ් (ප්‍රයිවට්) ලිමිටඩ්, පී වී 7155, සිය සමාගම් නාමය ඩයිනාවොෂ් ලිමිටඩ් ලෙසට වෙනස් කර ඇති බව 2007 අංක 7 දරන සමාගම් පනතේ 11 (1) වගන්තිය ප්‍රකාරව මෙයින් දැනුම් දෙනු ලැබේ.

ලියාපදිංචි ලිපිනය : ලෙවල් 4, ඇක්සස් ටවර්ස්, අංක 278, යුනියන් පෙදෙස, කොළඹ 02
දිනය : 2010 ඔක්තෝබර් මස 21 වැනි දින.

නටාෂා ඇරැව්වාවල,
සමාගම් ලේකම්.

12-1130

---

### දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනත

**බිග් සන්ෂයින් (ප්‍රයිවට්) ලිමිටඩ් පී. වී. 75816**

ඉහත සඳහන් සමාගම 2010 දෙසැම්බර් මස 06 වැනි දින සංස්ථාවක් කළ බව සහ එහි ලියාපදිංචි කාර්යාලය අංක 19 ඒ, ශාන්ත මේරිස් පාර, ගල්කිස්ස ලිපිනයේ පවත්වාගෙන යන බව 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ මින් දැනුම් දෙමු.

බිස්නස් ඇන්ඩ් ඉන්ඩස්ට්‍රියල් කන්සල්ටන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

අංක 65/2, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත,
කොළඹ 02.
2010 දෙසැම්බර් මස 13 වැනි දින.

12-936

---

### ඇටෝර්නි බලකරය අවලංගු කිරීම

පේරාදෙණිය, දංගොල්ල වීදියේ අංක 10/2 හි පදිංචිව සිට දැනට ඕස්ට්‍රේලියාවේ No. 3/13, Strathairlia Square Mgragar QLD 4 109 පදිංචිව සිටින කාන්ත වලව්වේ පුනර්ජිව පුන්චන්ද්‍ර පුෂ්පපායා වේරගම (හැ. අංක 713461350 V) වන මම, මැණික්හින්න, අංක 15 "නයනා" දොඩන්ගොල්ල පදිංචි නානායක්කාර වර්ණකුළ පටබැඳිගේ සමන් උදයකුමාර පෙරේරා (හැ. අංක. 711671633 V) හිමි යන අයට වර්ෂ 2010 ක් වූ පෙබරවාරි මස 06 වැනි දින මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් ප්‍රදීප් විජේරත්න මහතා විසින් ලියා සහතික කරන ලද අංක 434 දරන ඇටෝර්නි බලපත්‍රය අද දින අවලංගු කරන ලද බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් සහ මහජනතාවටත් මෙයින් දන්වා සිටිමි.

තව ද, ඔහු විසින් මාගේ නමින් අද දින සිට කරනු ලබන සියලුම ගණුදෙනු සහ සියලුම කටයුතු වෙනුවෙන් වග කිව යුතු නොවන බවට ද මෙයින් ප්‍රකාශ කොට සහතික කරමි.

කේ. ඩබ්ලිව්. පී. පී. පී. වේරගමගේ,
නිත්‍යානුකූල ඇටෝර්නි බලකර,
පාලිනි ටිකිරි කුමාරි ඉඹුල්දෙණිය.

(හැ. අංක. 448301079 V)
අංක 100, අංගම්මන වලව්ව,
අංගම්මන, ගම්පොල.
2010 ඔක්තෝබර් මස 27 වැනි දින.

12-1092

### ප්‍රසිද්ධ දැන්වීම

සීමාසහිත ලක්දිනිඳු ඉංජිනියරිං (පුද්ගලික) සමාගම (සමාගම් අංකය පී වී 66314) වර්ෂ 2008 නොවැම්බර් මස 25 වැනි දින සංස්ථාගත කරන ලද බව 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) උප වගන්තිය ප්‍රකාරව මෙයින් සැම දෙනාගේ ම දැනගැනීම පිණිස දැනුම් දෙනු ලැබේ.

ලියාපදිංචි කාර්යාලය : අංක 438, කොළඹ පාර, උතුරු මාම්පේ, පිළියන්දල, ශ්‍රී ලංකාව.

12-946

### ඇටෝර්නි බලපත්‍රය (විශේෂ) අවලංගු කිරීම

දෙල්ගොඩ, කඳුබොඩ අංක 126 දරන ස්ථානයේ පදිංචි මැදදූව ලියනගේ දයානන්ද වන මා 2010 සැප්තැම්බර් මස 07 වැනි දින ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් එච්. ආර්. පී. සේනානායක ලියා සහතික කරන ලද අංක 379 දරන විශේෂ ඇටර්නි බලපත්‍රය තුලින් මා විසින් පත් කරන ලද කඩවත, පුවක්වැටිය පාර, අංක 472/1 හි ලියාපදිංචි ලිපිනයැති සී/ස සිරි එන්ටප්‍රයිසස් සමාගම (ප්‍රයිවට්) වෙත ලබා දී ඇති විශේෂ ඇටර්නි බලපත්‍රය අවලංගු කළ බව ශ්‍රී ලංකා ජනරජයට දැනුම් දෙමු.

මැදදූව ලියනගේ දයානන්ද,

අංක 126, කඳුබොඩ,
දෙල්ගොඩ.
2010 දෙසැම්බර් මස 13 වැනි දින දී ය.

12-987

---

### ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

නුගේගොඩ, ගංගොඩවිල හයිලෙවල් පාර, අංක 657 සහ එක්සත් රාජධානිය ක්ලැෆම් සවුත් නයිටින්ගේල් ලේන්, වෙස්ට්බරි කෝට්, අංක 77 හි පදිංචි චාමලි පුෂ්පා පෙරේරා (ගුවන් ගමන් බලපත්‍ර අංක එම් 2281983 සහ ජා. හැ. අංක 465192178 V) වන මා විසින් රත්ගම, පල්ලියපිටිය, "තුසිත" හි පදිංචි දේමුණි ජානක සේනාධීර යන අය වෙත ප්‍රදානය කර ඇති කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් යූ. ඒ. ප්‍රේමසුන්දර විසින් වර්ෂ 2007.01.16 වැනි දින ලියා සහතික කළ අංක 2497 දරන ඇටෝර්නි බලපත්‍රය වර්ෂ 2010.12.01 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි මෙයින් ප්‍රත්‍යාදිෂ්ට කොට, බලරහිත කොට අවලංගු කර ලද බවත්, ඔහු විසින් කරනු ලබන කිසිදු ක්‍රියාවකට මා වග නොකියන බවත්, ඒ හා සම්බන්ධ කිසිදු වගකීමකට මා නොබැඳෙන බවත්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් ශ්‍රී ලංකාවාසී ජනතාවටත් මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඇටෝර්නි අධිපති.

12-960

---

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

### හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. - කොල්ලුපිටිය ශාඛාව (කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව යනුවෙන් හඳුන්වනු ලැබූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම පිළිබඳ දැන්වීම

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. ආර්. ද සිල්වා විසින් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී නමට ලියා සහතික කරන ලද 2007.12.20 වැනි දින සහ අංක 2333 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම නෙළුම් කුමාරි කොකනට් ඔයිල් ඩිස්ට්‍රිබියුටර්ස් - මීගමුව යන නාමය විලාශය සහ අභිධානය යටතේ තනි පුද්ගල ව්‍යාපාරයක් පවත්වාගෙන යන රන්මුතු සාලිය චමින්ද සම්පත් ප්‍රනාන්දු යන අය බන්ධනදායී ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී ණය මුදල් සහ ඒ මත අයවිය යුතු නෛතික පොලිය සහ වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළු සියලු මුදල් ප්‍රමාණයන් ද (තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල අඩුකොට) අයකර ගැනීම සඳහා ඉහත කී හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. ආයතනය මා වෙත පවරා ඇති බලතල අනුව විස්තර කර ඇත්තා වූ ද, දේපළ වර්ෂ 2011 ක් වූ පෙබරවාරි මස 09 වැනි දින ප. ව. 1.30ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ මීගමුව නගර සභා සීමාව තුළ බෝලවලාන-කොට්ඨාශ අංක 2 තුළ පිහිටි ශාන්ත ජෝසප් වීදියෙහි දැනට වරිපනම් අංක 190 දරන බෙලිගහකුඹුර නමැති ඉඩමට බලයලත් මානක ඩබ්. එස්. එස්. පෙරේරා, එම්. එම්. එස්. ප්‍රනාන්දු විසින් මැන සකස් කරන ලද 2005.02.02 වැනි දින දරන අංක 5306 පිඹුරේ බෙදා වෙන් කරන ලද කොටස (අංක 2107හි ලොට් ඒ) ප්‍රමාණය රූඩ් එකයි පර්චස් දොළහයි දශම පහක් (අ. 0, රූ. 1, පර්. 12.5)

*පිවිසීම.-* කොළඹ මීගමුව පාරේ කි. මී. 28 ක් පමණ ගමන් කොට වමට හැරී යන ශාන්ත ජෝසප් පාරේ මීටර් 50ක් පමණ ගමන් කිරීමේ දී එම පාරට යාබදව වම් පැත්තේ මෙම දේපළ පිහිටා ඇත.

මේ පිළිබඳ යෝජනා සම්මුතිය 2009.10.16 වැනි දින *රජයේ ගැසට් පත්‍රයේ* සහ 2009.10.20 වැනි දින අයිලන්ඩ්, දිවයින සහ තිනකරන් පත්‍රවල පළ වී ඇත.

*ගෙවීමේ ක්‍රමය.-*වෙන්දේසිය අවසන් වනවාත් සමගම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් මුදලින් කළ යුතු අතර චෙක්පත් භාරගනු නොලැබේ.

1. ගැණුම් මිලෙන් සියයට දහයක් (10%) ක්,
2. ප්‍රාදේශීය සභා බදු සියයට එකක් (1%) ක්,
3. සියලුම ප්‍රචාරක වියදම්,
4. වෙන්දේසිකරුගේ කොමිස් මුදල් (ගැණුම් මිලෙන් 2.5%)
5. විකුණුම් කොන්දේසි පිළියෙල කිරීමේ හා නොතාරිස් ගාස්තු,
6. ලිපිකරු හා සෝෂක ගාස්තු

ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනුවක් (90%) විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. ආයතනයට ගෙවිය යුතු අතර එසේ ගෙවීමට අපොහොසත් වුවහොත් ඒ වනවිට ගෙවා ඇති මුදල් ආපසු නොගෙවන එම දේපළ නැවත වෙන්දේසියේ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු තිරප්පු පරීක්ෂාව සඳහා ජොෂ්ඨ කළමණාකරු (ණය අයකිරීම්), හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී., අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10, දුරකථන අංක : 2661826, 2661835.

හේමචන්ද්‍ර දළුවත්ත,
උසාවි කොමසාරිස් බලයලත්
වෙන්දේසිකරු සහ තක්සේරුකරු.

අංක 99, උසාවිය පාර, කොළඹ 12
දුරකථනය : 071-4175944, 075 8489378.

12-1097

---

## හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - වෙන්නප්පුව ශාඛාව
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව යනුවෙන් හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ජී. එම්. එම්. ප්‍රනාන්දු විසින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී නමට ලියා සහතික කරන ලද 2006.09.28 වැනි දින සහ අංක 1694 සහ 2007.05.10 වැනි දින අංක 1974 දරන බැඳුම්කරයන් යටතේ අයවිය යුතු මුදල් ගෙවීම වර්ණකුලසූරිය බම්මනගේ තිලක් නාලක මධුවන්ත ප්‍රනාන්දු බන්ධනදායී ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී ණය මුදල් සහ ඒ මත අයවිය යුතු නෛතික පොලිය සහ වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළු සියලු මුදල් ප්‍රමාණයන් ද (තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල අඩුකොට) අයකර ගැනීම සඳහා ඉහත කී හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී ආයතනය මා වෙත පවරා ඇති බලතල අනුව පහත විස්තර කර ඇති දේපළ වර්ෂ 2011 ක් වූ ජනවාරි මස 27 වැනි දින ප.ව. 1.30 ට එම දේපළ පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

### උපලේඛනය

වයඹ පළාතේ (මාරවිල ඉඩම් ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයට අයත්) පුත්තලම දිස්ත්‍රික්කයේ දකුණු පිටිගල් කෝරලේ කම්මල් පත්තුවේ කම්මල්පත්තුව උපකාර්යාලය නයිනමඩම සීමාව තුළ දුම්මලදෙණිය බටහිර ගමෙහි පිහිටි මාදන්ගහවත්ත සියඹලාගහවත්ත සහ තාප්පෝවිට සහ මාදන්ගහවත්ත මාදන්ගහවත්ත සහ තාප්පෝවිට නමැති ඉඩමට බලයලත් මානක ඩබ්. එල්. එච්. ප්‍රනාන්දු විසින් මැන සකස් කරන ලද 2006.05.16 වැනි දින අංක 6884 දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද කැබලි අංක 2 දරන ඉඩම් කොටස ප්‍රමාණය පර්චස් විස්සක් (අ. 0, රූ. 0, පර්. 20).

*පිවිසීම*.-වෙන්නප්පුව නගරයේ සිට කි. මී. 24 (කොළඹ - පුත්තලම ප්‍රධාන මාර්ගයේ 44 වැනි කි. මී. කණුවේ සිට මීටර් 30 පමණ කොළඹ දෙසට) ගමන්කොට දකුණට හැරී යන අඩි 12 ක පාරක් සඳහා වෙන් කරන ලද මාර්ගයේ මීටර් 135ක් ගමන් කිරීමේ දී දකුණු පසට වන්නට මෙම දේපළ පිහිටා ඇත.

මේ පිළිබඳ යෝජනා සම්මුතිය 2009.12.04 වැනි දින *රජයේ ගැසට් පත්‍රයේ ද*, 2009.12.02 වැනි දින අයිලන්ඩ්, දිවයින, තිනකරන් පත්‍රවල පළ වී ඇත.

*ගෙවීමේ ක්‍රමය*.- වෙන්දේසිය අවසන් වනවාත් සමගම සාර්ථක ගැණුම්කරු විසින් පහත ගෙවීම් මුදලින් කළ යුතු අතර චෙක්පත් භාරගනු නොලැබේ.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. ප්‍රාදේශීය සභා බදු සඳහා 1% (සියයට එකයි),
3. සියලුම ප්‍රචාරක වියදම්,
4. වෙන්දේසිකරුගේ කොමිස් මුදල් (ගැණුම් මිලෙන් 2.5%),
5. විකුණුම් කොන්දේසි පිළියෙල කිරීමේ හා නොතාරිස් ගාස්තු,
6. ලිපිකරු හා සෝෂක ගාස්තු.

ගැණුම් මිලෙන් 90%ක් (සියයට අනුවක්), විකිණීමේ දින සිට දින 30 ක් ඇතුළත දී හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී ආයතනයට ගෙවිය යුතු අතර එසේ ගෙවීමට අපොහොසත් වුවහොත් ඒ වන විට ගෙවා ඇති මුදල් ආපසු නොගෙවන අතර එම දේපළ නැවත වෙන්දේසියේ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාල ඔප්පු තිරප්පු පරීක්ෂාව සඳහා ජොෂ්ඨ කළමණාකරු (ණය අයකිරීම් ), හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී, අංක 479, ටී. බී. ජායා මාවත, කොළඹ 10. දුරකථන අංක : 2661826 - 2661835 ලබා ගත හැක.

හේමචන්ද්‍ර දළුවත්ත,
උසාවි කොමසාරිස් බලයලත් වෙන්දේසිකරු,
සහ තක්සේරුකරු.

අංක 99, උසාවිය පාර,
කොළඹ 12.
දුරකථන අංකය : 071-4175944,
075-8489378.

12-1099

---

## හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - මෝදර ශාඛාව
කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව යනුවෙන් හඳුන්වනු ලැබූ

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. ආර්. ද සිල්වා විසින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී නමට ලියා සහතික කරන ලද 2004.10.01 වැනි දින අංක

1265 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ෆාතිමා මුහාර්රිසා ජාල්ඩීන් (විවාහයට පෙර බාවා) සහ මොහොමඩ් සෙයිනුඩීන් ඉක්බාල් ජාල්ඩීන් යන අයවළුන් බන්ධනදායී ණයකරුවන් හැටියට පැහැර හැර ඇති හෙයින් එකී ණය මුදල් සහ ඒ මත අයවිය යුතු නෛතික පොලිය සහ වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළු සියලු මුදල් ප්‍රමාණයන් ද (තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල අඩුකර) අයකර ගැනීම සඳහා ඉහත කී හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. ආයතනය මා වෙත පවරා ඇති බලතල අනුව පහත විස්තර කර ඇති දේපළ වර්ෂ 2011 ක් වූ ජනවාරි මස 25 වැනි දින පෙ.ව. 11.30 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ හේවාගම් කෝරලේ පල්ලේ පත්තුවේ කඩුවෙල ප්‍රාදේශීය සභා සීමාවට අයත් බත්තරමුල්ල ඒකකය තුළ අකුරේගොඩ පිහිටි හෝකන්දර පාරේ වරිපනම් අංක 253/23බී දරන මිල්ලගහවත්තඹිවිට හෙවත් අළුබෝගහලන්ද නමැති ඉඩමට බලයලත් මානක ඩී. ඩී. හෙට්ටිගේ විසින් මැන සකස් කරන ලද 2003.06.25 වැනි දින අංක 3963 දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද ලොට් 'ඒ' ප්‍රමාණය පර්චස් පහලොවකි. (අ. 0, රූ. 0, පර්. 15).

*පිවිසීම.*- බත්තරමුල්ල - පැලවත්ත හන්දියේ සිට අකුරේගොඩ පාරේ කි. මී. 1 1/2 පමණ ගමන් කිරීමේ දී වම් පැත්තේ හමුවන සාම මාවතේ මීටර් 400 ක් පමණ ගමන් කිරීමේ දී වම් පැත්තේ වරිපනම් අංක 548/12 වශයෙන් මෙම දේපළ පිහිටා ඇත.

මේ පිළිබඳ යෝජනා සම්මුතිය 2009.10.30 වැනි දින *රජයේ ගැසට්* පත්‍රයේ ද, 2009.11.04 වැනි දින අයිලන්ඩ්, දිවයින, තිනකරන් පත්‍රවල ද පළ වී ඇත.

*ගෙවීමේ ක්‍රමය.*- වෙන්දේසිය අවසන් වනවාත් සමගම සාර්ථක ගැණුම්කරු විසින් පහත ගෙවීම් මුදලින් කළ යුතු අතර චෙක්පත් භාරගනු නොලැබේ.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. ප්‍රාදේශීය සභා බදු සඳහා 1% (සියයට එකයි),
3. සියලුම ප්‍රචාරක වියදම්,
4. වෙන්දේසිකරුගේ කොමිස් මුදල් (ගැනුම් මිලෙන් 2.5%),
5. විකුණුම් කොන්දේසි පිළියෙල කිරීමේ හා නොතාරිස් ගාස්තු,
6. ලිපිකරු හා සෝෂක ගාස්තු.

ගැණුම් මිලෙන් 90% ක් (සියයට අනූවක්), විකිණීමේ දින සිට දින 30 ක් ඇතුළත දී හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී ආයතනයට ගෙවිය යුතු අතර එසේ ගෙවීමට අපොහොසත් වුවහොත් ඒ වන විට ගෙවා ඇති මුදල් ආපසු නොගෙවන අතර එම දේපළ නැවත වෙන්දේසියේ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු තිරප්පු පරීක්ෂාව සඳහා ජ්‍යෙෂ්ඨ කළමණාකරු (ණය අයකිරීම්), හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී., අංක 479, ටී. බී ජායා මාවත, කොළඹ 10. දුරකථන අංක : 2661826, 2661835 ලබා ගත හැක.

හේමචන්ද්‍ර දළුවත්ත,
උසාවි කොමසාරිස් බලයලත් වෙන්දේසිකරු,
සහ තක්සේරුකරු.

අංක 99, උසාවිය පාර,
කොළඹ 12.
දුරකථන අංකය : 071-4175944
075-8489378

12-1098

---

## හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - ප්‍රධාන කාර්යාලයීය ශාඛාව

(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව යනුවෙන් හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එම්. පී. එම්. මොහොට්ටි විසින් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී නමට ලියා සහතික කරන ලද 2004.07.26 වැනි දින සහ අංක 2392 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ප්‍රභා දර්ශන සෙනෙවිරත්න යන අය බන්දනදායී ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී ණය මුදල් සහ ඒ මත අයවිය යුතු නෛතික පොලිය සහ වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළු සියලු මුදල් ප්‍රමාණයන් ද (තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල අඩුකොට) අයකර ගැනීම සඳහා, ඉහත කී හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී ආයතනය මා වෙත පවරා ඇති බලතල අනුව පහත විස්තර කර ඇති දේපළ වර්ෂ 2011 ක් වූ ජනවාරි මස 31 වැනි දින පෙ. ව. 11.30 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ හේවාගම් කෝරලේ පල්ලේ පත්තුවේ කඩුවෙල ප්‍රාදේශීය සභා සීමාව තුළ බත්තරමුල්ල ඒකකය තුළ තලංගම දකුණ සහ තලවතුගොඩහි පිහිටි වික්‍රමසිංහපුර පාරේ වරිපනම් අංක 82/18 දරන ශාන්ත තෝමස් ස්ටේට් නැමැති ඉඩමට බලයලත් මානක ඒ. එෆ්. සමීර් විසින් මැන සකස් කරන ලද 1967.07.06 වැනි දින අංක 914 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 87 දරන ඉඩම් ප්‍රමාණය : පර්චස් විසි එකක් (අ. 0, රූ, 0, පර්. 21)

*පිවිසීම.*-කොළඹ - කඩුවෙල මාර්ගයේ බත්තරමුල්ල හන්දිය දක්වා ගමන් කර දකුණට හැරී යන පන්නිපිටිය පාරේ කි. මී. 3 ක් පමණ ගමන් කිරීමේ දී හමුවන වික්‍රමසිංහ පුර හන්දියෙන් වමට හැරී වික්‍රමසිංහපුර පාරේ කි. මී. 1ක් පමණ ගමන් කිරීමේ දී හමුවන ITN ගොඩනැගිල්ල පසුකොට ගමන් කොට දකුණට හැරී යන 14 වැනි පටුමග ඔස්සේ (ITN ගොඩනැගිල්ල පසුකොට ගමන් කිරීමේ දී හමුවන 2 වැනි පටුමග) මීටර් 250 ගමන් කොට එතැනින් වමට හැරී ගමන් කිරීමේ දී එම පාරට යාබදවම දකුණු පැත්තේ මෙම දේපළ පිහිටා ඇත.

මේ පිළිබඳ යෝජනා සම්මුතිය 2010.05.14 වැනි දින *රජයේ ගැසට්* පත්‍රයේ ද 2010.05.18 වැනි දින අයිලන්ඩ්, දිවයින, තිනකරන් පත්‍රවල පළ වී ඇත.

*ගෙවීමේ ක්‍රමය.*- වෙන්දේසිය අවසාන වනවාත් සමගම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් මුදලින් කළ යුතු අතර චෙක්පත් භාරගනු නොලැබේ.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. ප්‍රාදේශීය සභා බදු සඳහා 1% (සියයට එකයි),
3. සියලුම ප්‍රචාරක වියදම්,
4. වෙන්දේසිකරුගේ කොමිස් මුදල් (ගැනුම් මිලෙන් 2 1/2%),
5. විකුණුම් කොන්දේසි පිළියෙල කිරීමේ හා නොතාරිස් ගාස්තු,
6. ලිපිකරු හා සෝෂක ගාස්තු.

ගැණුම් මිලෙන් 90% ක් (සියයට අනූවක්), විකිණීමේ දින සිට දින 30 ක් ඇතුලත දී හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී ආයතනයට ගෙවිය යුතු අතර එසේ ගෙවීමට අපොහොසත් වුවහොත් ඒ වන විට ගෙවා ඇති මුදල් ආපසු නොගෙවන අතර එම දේපළ නැවත වෙන්දේසියේ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු තිරප්පු පරීක්ෂාව සඳහා ජොෂ්ඨ කළමණාකරු (ණය අයකිරීම්) හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී අංක 479 ටී බී ජායා මාවත, කොළඹ 10 - දුරකථන අංක 2661826 - 2661835 න් ලබා ගත හැක.

හේමචන්ද්‍ර දළුවත්ත,
උසාවි කොමසාරිස් බලයලත් වෙන්දේසිකරු,
සහ තක්සේරුකරු.

අංක 99, උසාවිය පාර,
කොළඹ 12,
දුරකථන අංක : 071-4175944, 075-8489378.

12-1103

---

## හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - හෝමාගම ශාඛාව
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව යනුවෙන් හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම පිළිබඳ දැන්වීම

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් කේ. සේනානායක විසින් හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. නමට ලියා සහතික කරන ලද 2006.03.10 දින සහ අංක 1694 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම මහගොඩ විතානගේ ස්වර්ණා ජයසූරිය යන අය බන්ධනදායී ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී ණය මුදල් සහ ඒ මත අයවිය යුතු නෛතික පොලිය සහ වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළු සියලු මුදල් ප්‍රමාණයන් ද (තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල අඩුකොට) අයකර ගැනීම සඳහා ඉහත කී හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. ආයතනය මා වෙත පවරා ඇති බලතල අනුව පහත විස්තර කර ඇත්තාවූ දේපළ වර්ෂ 2011ක් වූ ජනවාරි මස 17 වැනි දින ප. ව. 1.30 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරළයේ පල්ලේ පත්තුවේ මහරගම නගර සභා සීමාව තුළ පන්නිපිටියේ මහමේසවත්ත පාරේ හි මහමේස එස්ටේට් නොහොත් මහමේසවත්ත නමැති ඉඩමට බලයලත් මානක ඒ. ඩී. විතාන විසින් සකස් කරන ලද 2006.02.20 වැනි දින දරන අංක 1488 පිඹුරේ බෙදා වෙන් කරන ලද ලොට් 1 දරන කොටස ප්‍රමාණය පර්චස් විස්සක් (අ. 0 රූ. 0 පර්. 20)

*පිවිසීම*.-කොළඹ් අවිස්සාවේල්ල (හයිලෙවල් පාරේ) මහරගම නගරය පසුකොට මද දුරක් ගමන් කිරීමේ දී හමුවන ගුරු අභ්‍යාස විදුහල පසු කොට දකුණට හැරී යන මහමේසවත්ත පාරේ ගමන්කොට පළමුව වමට හැරී යන පල්ලිය පටුමග ඔස්සේ ගමන් කොට ශාන්ත මේරි පල්ලිය ඉදිරිපිටින් ඇති පළමු පටුමග ඔස්සේ (බොරළු සහිත පාරේ) ගමන් කිරීමේ දී එම මාර්ගයේ දකුණට වන්නට මෙම දේපළ පිහිටා ඇත.

මේ පිළිබඳ යෝජනා සම්මුතිය 2009.10.02 වැනි දින රජයේ ගැසට් පත්‍රයේ ද 2009.10.06 වැනි දින අයිලන්ඩ් දිවයින සහ තිනකරන් පත්‍රවල පළ වී ඇත.

*ගෙවීමේ ක්‍රමය*.- වෙන්දේසිය අවසාන වනවාත් සමගම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් මුදලින් කළ යුතු අතර චෙක්පත් භාරගනු නොලැබේ.

1. ගැණුම් මිලෙන් සියයට දහයක් (10%)ක් ,
2. ප්‍රාදේශීය සභා බදු සියයට එකක් (1%)ක්,
3. සියලුම ප්‍රචාරක වියදම්,
4. වෙන්දේසිකරුගේ කොමිස් මුදල් (ගැණුම් මිලෙන් 2 1/2%),
5. විකුණුම් කොන්දේසි පිළියෙල කිරීමේ හා නොතාරිස් ගාස්තු,
6. ලිපිකරු හා සෝෂක ගාස්තු.

ගැණුම් මිලෙන් 90% ක් (සියයට අනූවක්), විකිණීමේ දින සිට දින 30 ක් ඇතුළත දී හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී ආයතනයට ගෙවිය යුතු අතර එසේ ගෙවීමට අපොහොසත් වුවහොත් ඒ වන විට ගෙවා ඇති මුදල් ආපසු නොගෙවන අතර එම දේපල නැවත වෙන්දේසියේ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු තිරප්පු පරීක්ෂාව සඳහා ජොෂ්ඨ කළමණාකරු (ණය අයකිරීම්) හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී අංක 479 ටී බී ජායා මාවත, කොළඹ 10 - දුරකථන අංක 2661826, 2661835 ලබා ගත හැක.

හේමචන්ද්‍ර දළුවත්ත,
උසාවි කොමසාරිස් බලයලත් වෙන්දේසිකරු,
සහ තක්සේරුකරු.

අංක 99, උසාවිය පාර,
කොළඹ 12,
දුරකථන අංක : 071-4175944, 075-8489378.

12-1101

---

## හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - අලුත්ගම ශාඛාව
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව යනුවෙන් හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

පානදුර ප්‍රසිද්ධ නොතාරිස් පී. වී. එන්. ඩබ්. පෙරේරා විසින් හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. නමට ලියා සහතික කරන ලද 2008.09.16 වැනි දින සහ අංක 2533 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම වෙත්තමුනි කමල් හේමන්ත ද සිල්වා සහ දෙමුනි ශෂිකලා නිම්මි ද සොයිසා බන්ධනදායී ණයකරුවන් හැටියට පැහැර හැර ඇති හෙයින් එකී ණය මුදල් සහ ඒ මත අයවිය යුතු නෛතික පොලිය සහ වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළු සියලු මුදල් ප්‍රමාණයන් ද (තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල අඩුකොට) අයකර ගැනීම සඳහා,

ඉහත කී හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සි. ආයතනය මා වෙත පවරා ඇති බලතල අනුව පහත විස්තර කර ඇති දේපළ වර්ෂ 2011 ක් වූ පෙබරවාරි මස 11 වැනි දින ප. ව. 1.30 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කයේ කළුතර තොටමුණ දකුණ අලුත්ගම් බැද්දේ බේරුවල ප්‍රාදේශීය සභා සීමාවට අයත් අළුත්ගම මාලෙවන් බැද්ද උපකාර්යාල සීමාව තුළ මොරගල්ලෙහි පිහිටි පංචිපෙල වත්ත සහ උස්වත්ත නමැති ඉඩමට බලයලත් මානක එන්. ලියනගේ විසින් මැන සාදන ලද 2008.05.25 වැනි දින අංක 118/2008 දරන පිඹුරේ ලොට් බී දරන කොටස, ප්‍රමාණය පර්චස් දහඅට (අ. 0 රූ, 0 පර්. 18)

*පිවිසීම.*-බේරුවල නගර මධ්‍යයේ සිට ගාලු පාරේ කි. මී. 4.5ක් ගමන් කිරීමේ දී හමුවන 6 වැනි පටුමගේ (බාබේරියන් හෝටලයට පිවිසෙන පාර) වම් පසට වන්නට පිහිටා ඇත.

මේ පිළිබඳ යෝජනා සම්මුතිය 2009.08.07 වැනි දින *රජයේ ගැසට් පත්‍රයේ*ද 2009.12.03 වැනි දින අයිලන්ඩ් දිවයින, තිනකරන් පත්‍රවල පළ වී ඇත.

*ගෙවීමේ ක්‍රමය.*- වෙන්දේසිය අවසාන වනවාත් සමගම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් මුදලින් කළ යුතු අතර චෙක්පත් භාරගනු නොලැබේ.

1. ගැණුම් මිලෙන් සියයට දහයක් (10%)ක් ,
2. ප්‍රාදේශීය සභා බදු සදාහ 1% (සියයට එකක),
3. සියලුම ප්‍රචාරක වියදම්,
4. වෙන්දේසිකරුගේ කොමිස් මුදල් (ගැණුම් මිලෙන් 2 .5%),
5. විකුණුම් කොන්දේසි පිළියෙල කිරීමේ හා නොතාරිස් ගාස්තු,
6. ලිපිකරු හා සෝෂක ගාස්තු.

ගැණුම් මිලෙන් 90% ක් (සියයට අනූවක්), විකිණීමේ දින සිට දින 30 ක් ඇතුළත දී හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී ආයතනයට ගෙවිය යුතු අතර එසේ ගෙවීමට අපොහොසත් වුවහොත් ඒ වන විට ගෙවා ඇති මුදල් ආපසු නොගෙවන අතර එම දේපල නැවත වෙන්දේසියේ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු තිරප්පු පරීක්ෂාව සඳහා ජ්‍යෙෂ්ඨ කළමණාකරු (ණය අයකිරීම්) හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී අංක 479 ටී බී ජායා මාවත, කොළඹ 10 - දුරකථන අංක 2661826, 2661835 ලබා ගත හැක.

හේමචන්ද්‍ර දළුවත්ත,
උසාවි කොමසාරිස් බලයලත් වෙන්දේසිකරු,
සහ තක්සේරුකරු.

අංක 99, උසාවිය පාර,
කොළඹ 12,
දුරකථන අංක : 071-4175944, 075-8489378.

12-1096

---

## හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - හෝමාගම ශාඛාව

(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව යනුවෙන් හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම පිළිබඳ දැන්වීම

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් කාංචනා සේනානායක විසින් 2005.09.23 වැනි දින හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී නමට ලියා සහතික කරන ලද අංක 1576 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම මාරි ඩී ක්ලැසික් ඇටයර් (ප්‍රයිවෙට්) ලිමිටඩ් යන අය බන්ධනදායි ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින්, එකී ණය මුදල් සහ ඒ මත අයවිය යුතු නෛතික පොලිය සහ වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළු සියලු මුදල් ප්‍රමාණයන් ද (තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල අඩුකොට) අයකර ගැනීම සඳහා ඉහත කී හැටන් නැෂනල් බැන්ක් පී එල් සී ආයතනය මා වෙත පවරා ඇති බලතල අනුව පහත විස්තර කර ඇත්තාවූ ද දේපළ වර්ෂ 2011ක් වූ ජනවාරි මස 17 වැනි දින පෙ. ව. 11.30 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

### උපලේඛනය

දේපල.- බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ අධිකාරි පත්තුවේ, මහර ප්‍රාදේශීය සභා සීමාව තුළ, මහර සූරියපාළුව හි පිහිටි මිල්ලගහවත්ත නමැති ඉඩමට බලයලත් මානක ජී. එල්. බී. නානායක්කාර විසින් මැන සාදන ලද 1990.07.24 දින සහ අංක 8925 දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද ලොට් 10 දරන ඉඩම සහ එහි ඇති සියලු දේත්වේ. විශාලත්වය පර්චස් 13.50 වේ.

ඉහත කී අංක 8925 දරන පිඹුරේ ලොට් 7 සහ 11 ලෙස ලකුණු කර ඇති පාරවල් සඳහා වෙන් කර ඇති ඉඩම් කොටස් මතින් මාර්ග අයිතිය ද සමග වේ.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2010.08.27 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* හා 2010.09.07 දින අයිලන්ඩ්, දිවයින සහ තිනකරන් පුවත්පත් ද බලන්න.

ඉඩමට පිවිසීම.- නුවර පාරේ කඩවත සිට බැලුම්මහර පාරේ, කිරිල්ලවල මහ විදුහල පසුකොට සූරියපාලුව පාරට වමට හැරී දිස්ත්‍රික් ලේකම් කාර්යාලය (කලින් ප්‍ර. උ. දි. කාර්යාලය) පසුකොට බුදු පිළිමයද පසු කර ඉදිරියට ගමන් කර මංගල මාවත තුංමන්හන්දියෙන් වමට හැරී ඉදිරියට ගොස් දකුණට ඇති පස්වන පටුමගට හැරී මීටර් කිහිපයක් ඉදිරියට ගියවිට, ද්විත්ව මාර්ග ඉදිරිපසක් සහිතව අංක 80 C යනුවෙන් සඳහන් දේපල දකුණට හැරෙනවාත් සමග වම් අත පැත්තේ පිහිටා ඇත.

ගෙවීමේ ක්‍රමය.- වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුය.

1. ගැණුම් මුදලින් සියයට දහය (10%) ක් ද ;
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එකක් (1%) ක් ද ;
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් සියයට දෙකයි දශම පහ (2.5%) ක් ද ;
4. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදාහක් (රු.2000) ක් ද ;
5. ලිපිකරු සහ සෝෂක ගාස්තු රුපියල් පන්සීය (රු.500) ක් ද ;
6. සියලුම ප්‍රචාරක වියදම් ද වේ.

ගැණුම් මුදලින් ඉතිරි සියයට අනූවක් (90%) ක් වූ මුදල විකිණීමේ දින සිට දින 30 ක් ඇතුළත හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත ගෙවිය යුතුය. දින 30 ක් ඇතුළත ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති සියයට දහයක (10%) මුදල අහිමි කිරීමට සහ දේපල නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාල ඔප්පු සහ ලියවිලි පරීක්ෂාව සහ වෙනත් තොරතුරු ජ්‍යෙෂ්ඨ කළමණාකරු (ණය අධීක්ෂණ සහ අය කිරීම්) හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී අංක 479, ටී. බී. ජායා මාවත, කොළඹ 10.

දුරකථන අංකය 2661826, 2661835 ලබා ගත හැක.

පියරත්න මුතුකුමාරණ,
(මුළු දිවයිනටම සාම විනිසුරු),
උසාවි කොමසාරිස්, තක්සේරුකරු
සහ බලයලත් වෙන්දේසිකරු

අංක 156- 1/13,
උසාවිය පාර,
කොළඹ 12.
දුරකථන අංක : 0777-378441,
0714-424478.
ෆැක්ස් අංකය: 0114-617059.

12-1065

---

### කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී - මහ වීදිය ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී (ලියාපදිංචි අංකය පීකිව් 116) මගින් මා වෙත පවරා ඇති බලතල ප්‍රකාර ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

බලයලත් මිනින්දෝරු එච්. එම්. ප්‍රනාන්දු විසින් 1960 මාර්තු මස 12 වැනි දින සාදන ලද අංක 726 දරන පිඹුරෙහි දැක්වෙන බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, පෙර මොරටුව නගර සභා සීමාවන් තුල වූ දැන් මොරටුව මහ නගර සභා සීමාවන් තුල තෙලවල ග්‍රාමයේ (බොරුපන ෆෙරි පාරෙන් එහා) වළගම්බා මාවත දිගේ පිහිටි ලේඩි කැතරීන් වතු සමූහයේ ගොඩනැගිලි සහ එහි පවත්නා අනෙකුත් සියළුදේත් සමග බෙදා වෙන් කර ඇති ලොට් 40 දරන පර්චස් විස්සක් (අ. 0, රූ. 0, පර්. 20)

2. ඉහත කී ලේඩි කැතරීන් වතු සමූහයේ බෙදා වෙන් කර ඇති ලොට් 41 දරන පර්චස් විස්සක් (අ. 0, රූ. 0. පර්. 20)

3. ඉහත කී ලේඩි කැතරීන් වතු සමූහයේ බෙදා වෙන් කර ඇති ලොට් 42 දරන පර්චස් විස්සක් (අ. 0, රූ. 0, පර්. 20) විශාල ඉඩම වේ.

රත්මලාන, බොරුපන, වළගම්බා මාවතේ, අංක 9 දරන ස්ථානයේ ලියාපදිංචි කාර්යාලය පවත්වාගෙන යන ශ්‍රී ලංකාවේ නිසි ලෙස ස්ථාපිත කරන ලද ලේක් ලන්ඩ් ඉන්ටර් ඇමරිකන් ස්කූල් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම ණයකරු හැටියට ද, සහ සිවරාසා සිවනාදන් උකස්කරු හැටියටද, පැහැර හැර ඇති හෙයින්ද, කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සීට උකස් කරන ලද ඉහත සඳහන් දේපළ, 2011 ජනවාරි මස 28 වැනි දින පෙ.ව. 11.30 ඉහත සඳහන් ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2010.08.06 වැනි දින *රජයේ ගැසට් පත්‍රයද* 2010.08.10 වැනි දින ලක්බිම, ද අයිලන්ඩ් සහ වීරකේසරී යන පුවත්පත් බලන්න. විකිණීම පිළිබඳව දැන්වීම සඳහා 2010.12.31 වැනි දින රජයේ *ගැසට් පත්‍රය* සහ 2011.01.12 දින ලක්බිම සහ ද අයිලන්ඩ් පුවත්පත් බලන්න.

*ඉඩමට පිවිසීම*.- මෙම දේපළ බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, මොරටුව මහ නගර සභා සීමාවේ, රත්මලාන, බොරුපනෙහි වළගම්බා මාවත දිගේ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය*.- විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතුය.

1. ගැණුම් මිලෙන් සියයට දහයක් (10%),
2. පළාත් සභා අයබදු සඳහා සියයට එකයි (1%),
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල් ගැණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%),
4. නොතාරිස් ගාස්තුව රු. 2000,
5. ලිපිකරු සහ සෝෂක වේතනය රු. 500,
6. වෙන්දේසිය සඳහා වැයකරන ලද සියළුම ප්‍රචාරක වියදම්,
7. ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනූව (90%) විකිණීමේ දින සිට දින 30 ක් තුලදී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී හි ප්‍රධාන කාර්යාලයේ හෝ මහ වීදිය ශාඛාවේ තැන්පත් කළ යුතුය.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න.

එල්. බී. සේනානායක,
සාම විනිසුරු, උසාවි කොමසාරිස්,
තක්සේරුකරු, බලයලත් ජ්‍යෙෂ්ඨ වෙන්දේසිකරු.

අංක 99,
උසාවිය පාර,
කොළඹ 12
දුරකථන : 011-3144520
දුරකථන/ෆැක්ස් : 011-2445393

කළමනාකරු,
කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී,
අංක 280,
මහ වීදිය,
කොළඹ 11.
දුරකථන අංක 2380490 -2
ෆැක්ස් අංකය : 2380493.

12-1091

---

### කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී -මීගමුව ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී (ලියාපදිංචි අංකය පී. කිව් 116) මගින් මා වෙත පවරා ඇති බලය ප්‍රකාර, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

බලයලත් මානක ඩී. පී. විමලසේන විසින් සකස් කරන ලද 2007 මාර්තු මස 27 දිනැති අංක 6310 දරන පිඹුර පරිදි බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව මහනගර සභා සීමාවන් තුල හුනුපිටිය 2 වැනි කොට්ඨාසයේ පිහිටි පොකුණබඩවත්ත කියන ඉඩමේ බෙදා වෙන්

කරන ලද ලොට් 1 ලෙස දරන පර්චස් දාහතක් (අ. 0, රූ.0, පර්. 17) විශාල ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි සහ සියලු දේත් සමග වේ. ඇන්තනි සුසිල් ලසන්ත ද සිල්වා ණයකරු හැටියට ඔහු විසින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී ට උකස් කරන ලද ඉහත සඳහන් දේපළ, 2011 ජනවාරි මස 31 වැනි දින පෙ.ව. 11.30 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2010.06.04 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* ද 2010.06.09 වැනි දින ලක්බිම, වීරකේසරී සහ ද අයිලන්ඩ් පුවත්පත් ද බලන්න. විකිණීම පිළිබඳ දැන්වීම සඳහා 2010.12.31 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* සහ 2011.01.13 වැනි දින ලක්බිම, ද අයිලන්ඩ් සහ වීරකේසරී පුවත්පත් ද බලන්න.

*ඉඩමට පිවිසීම.*- මෙම දේපළ වෙත ළඟාවීම සඳහා මීගමුවේ ආවේ මරියා කන්‍යාරාමය අසළ සිට මීගමුව - හලාවත මහා මාර්ගයේ යාර 350 ක් පමණ ගිය විට පාරට මායිම්ව දකුණු පසින් මෙම දේපළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.*-විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතුය :-

1. ගැණුම් මිලෙන් සියයට දහයක් (10%),
2. පළාත් සභා අයබදු සඳහා සියයට එකයි (1%),
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල් ගැණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%),
4. නොතාරිස් ගාස්තුව රු. 2,000,
5. ලිපිකරු සහ සෝෂක වේතනය රු. 500,
6. වෙන්දේසිය සඳහා වැය කරන ලද සියලුම ප්‍රචාරක වියදම්,
7. ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනුව (90%) විකිණීමේ දින සිට දින 30 ක් තුළ දී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී හි ප්‍රධාන කාර්යාලයේ හෝ මීගමුව ශාඛාවේ තැන්පත් කළ යුතුය.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම් සහ වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න :-

එල්. බී. සේනානායක,
සාමවිනිසුරු, ජ්‍යෙෂ්ඨ උසාවි කොමසාරිස්,
බලයලත් වෙන්දේසිකරු හා තක්සේරුකරු,
අංක 99,
උසාවිය පාර,
කොළඹ 12,
දුරකථන/ෆැක්ස් : 011-2445393.

කළමනාකරු,
කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී,
අංක 22-26,
ප්‍රනාන්දු ඇවනියු,
මීගමුව.
දුරකථන අංක : 031-2231813,
031-5675952.
ෆැක්ස් අංකය : 031-2227109.

12-1088

## ලංකා බැංකුව

ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 22 වැනි වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැන්වීම

**කුරුණෑගල, වඳුරාගල කොළඹ පාරේ අංක 192/1 හි පදිංචි රිචඩ් වික්‍රමසූරිය මහතා සහ පුෂ්පා චාන්දනී වික්‍රමසූරිය මහත්මිය යන අය විසින් උකස් කරන ලද දේපළ**

ණය යොමු අංකය : 2868319.

ලංකා බැංකු ආඥාපනතේ 19 වැනි වගන්තිය යටතේ ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරනු ලැබ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2007.07.13 දිනැති අංක 1506 දරන *ගැසට් පත්‍රයේ* හා 2007.07.09 දිනැති ඩේලිනිවුස්, දිනමිණ සහ තිනකරන් යන පුවත්පත් වල පළ කරන ලද යෝජනාවකට අනුකූලව එකී ආඥාපනතේ අංක 26 දරන වගන්තිය යටතේ අයකර ගත හැකි මුල් මුදලේ ශේෂය ද, විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අයවිය යුතු පොළිය ද, ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍ර පිහිටි ස්ථානයේ දීම 2011.01.17 වැනි දින පෙ. ව. 10.30 ට කුරුණෑගල මල්කඩුවාව, තල්ගොඩපිටිය මාවත, අංක 33 හි පදිංචි වෙන්දේසිකාර එච්. ඩබ්. ඒ. ජයලාල් මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිනු ලැබේ.

### *උපලේඛනය*

1. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ දඹදෙණි හත්පත්තුවේ රෙකොපත්තු කෝරළයේ අමුණුගම ග්‍රාමයේ පිහිටි "දෙණියවත්ත" නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු එල්. ඩී. මොල්ලිගොඩ විසින් සාදන ලද 2005.06.09 දිනැති අංක 5076 දරන පිඹුරේ ලොට් 01 වශයෙන් සඳහන් බෙදන ලද්දාවූ නිශ්චිත ඉඩම් කැබැල්ල උතුරට : අංක එෆ්. වී. පී. 1492 දරන පිඹුරේ ලොට් 77 හෙන්ද්‍රික්වත්ත ද, නැගෙනහිරට : බලයලත් මිනින්දෝරු ටී. ඒ. ආර්. තාඹුගල විසින් සාදන ලද අංක 606 දරන පිඹුරේ විස්තර කළ එම ඉඩමේ කොටසක් ද, දකුණට : රන්ජනගම සිට කොළඹ කුරුණෑගල ප්‍රධාන පාර දක්වා පාර සහ එකී අංක 5076 දරන පිඹුරේ ලොට් 2 (පර්චතය) සහ එකී අංක 5076 දරන පිඹුරේ ලොට් 3 (පර්චතය) ද, බස්නාහිරට : එකී අංක 5076 දරන පිඹුරේ ලොට් 2 සහ 3 (පර්චතය) සහ අංක 605 දරන පිඹුරේ එම ඉඩමේ ඉතිරි කොටසක් වූ ලොට් 2 ද, මායිම්ව රූඩ් තුනයි, පර්චස් තිහයි දශම අටයි තුනක (අ.0, රූ. 3, පර්. 30.83) බිම් ප්‍රමාණය සමග එහි පිහිටි ගහකොළ වැවිලි සහ සියලු දේ වේ. මෙය කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එෆ් 1268/117 හි ලියාපදිංචි කර ඇත.

එකී අමුණුගම ග්‍රාමයේ පිහිටි "දෙණියවත්ත" නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු එල්. ඩී. මොල්ලිගොඩ විසින් සාදන ලද 2005.06.09 දිනැති අංක 5076 දරන පිඹුරේ ලොට් 2 (පර්චතය) වශයෙන් සඳහන් බෙදන ලද්දාවූ නිශ්චිත ඉඩම් කැබැල්ල එකී අංක 5076 දරන පිඹුර අනුව උතුරට: නැගෙනහිරට සහ දකුණට : එකී අංක 5076 දරන පිඹුරේ ලොට් 1 ද, බස්නාහිරට : අංක 605 දරන පිඹුරේ මෙම ඉඩමේ ඉතිරි කොටසක් වූ ලොට් 2 ද, මායිම්ව පර්චස් හතයි දශම දෙකයි බිංදුවක (අ.0, රූ.0, පර්. 7.20) බිම් ප්‍රමාණය සමග එහි පිහිටි සියලු දේ වේ. මෙය කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එෆ් 1268/118 හි ලියාපදිංචි කර ඇත.

3. එකී අමුණුගම ග්‍රාමයේ පිහිටි "දෙණියවත්ත" නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු එල්. ඩී. මොල්ලිගොඩ විසින් සාදන ද 2005.06.09 දිනැති අංක 5076 දරන පිඹුරේ ලොට් 3 (පර්චතය) වශයෙන් සඳහන් බෙදන ලද්දාවූ නිශ්චිත ඉඩම් කැබැල්ල එකී අංක 5076 දරන පිඹුර අනුව උතුර

නැගෙනහිර, දකුණ හා බස්නාහිරට : එකී අංක 5076 දරන පිඹුරේ ලොට් 1 ද, මායිම්ව පර්චස් එකයි දශම නවයයි අටක (අ. 0 රූ. 0 පර්. 1.98) බිම් ප්‍රමාණය සමග එහි පිහිටි සියලු දේ වේ. මෙය කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එෆ් 1268/119 හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ආර්. එම්. ගුණවර්ධන මහතා,
කළමනාකරු.

ලංකා බැංකුව,
2 වැනි නගර ශාඛාව,
කුරුණෑගල.

12-1109

---

## සෙලාන් බැංකුව - පියස සෙන්ටර් ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ විකිණීම

මෙම දේපළ පිළියන්දල පදිංචි අර්නොලිස් කංකානම්ගේ ආනන්ද යන අය බන්ධනදායී වශයෙන් සෙලාන් බැංකුව පීඑල්සී වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළයේ උඩුගහ පත්තුවේ, හෝමාගම ප්‍රාදේශීය සභා සීමාව තුළ කුඩාමඩුව පිහිටි බලයලත් මිනින්දෝරු එස්. පී. රණසිංහ විසින් සාදන ලද 2001.09.10 දිනැති අංක 1174 දරන සැලැස්මේ සඳහන් දික්හේනේ කනත්ත හෙවත් දික්හේන එස්ටේට් නමැති ඉඩමේ ලොට් 94 ලකුණු කළ ඉඩම් කොටස පෙර කී අංක 1174 දරන සැලැස්ම අනුව පර්චස් දහතුනයි දශම හතරයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 13.40) විශාල ඉඩම.

එකී ලොට් 94 පහත විස්තර කරනු ලබන එකතු කළ ඉඩම් කොටස්වලින් බෙදා වෙන් කර ඇති අතර ලියාපදිංචිය ඒ හා සම්බන්ධ වනු ඇත :-

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළයේ, උඩුගහ පත්තුවේ, කුඩාමඩුව ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු එස්. පී. රණසිංහ විසින් සාදන ලද 2001.08.27 වැනි දිනැති අංක 1164 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන දික්හේන එස්ටේට් හෙවත් දික්හේනේ කනත්ත නමැති ඉඩමේ ලොට් 5 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස එකී අංක 1164 දරන සැලැස්ම අනුව පර්චස් දහතුනයි දශම හතරයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 13.40) *නොහොත්* හෙක්ටයාර් 0.03389 විශාල ඉඩම. මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එන් 153/192 හි ලියාපදිංචි කර ඇත.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළයේ උඩුගහ පත්තුවේ, කුඩාමඩුව ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු එස්. පී. රණසිංහ විසින් සාදන ලද 2001.08.27 වැනි දිනැති අංක 1164 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන දික්හේන එස්ටේට් හෙවත් දික්හේනේ කනත්ත නමැති ඉඩමේ ලොට් 4 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස එකී අංක 1164 දරන සැලැස්ම අනුව අක්කර තුනයි, පර්චස් විස්සක් (අ. 3, රූ. 0, පර්. 20) *නොහොත්* හෙක්ටයාර් 1.26465 විශාල ගොඩනැගිලි, ගස්, වගා සහ එහි පිහිටි සියලු දේ සමග ඉඩම. මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එන් 233/20 හි ලියාපදිංචි කර ඇත.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළයේ උඩුගහ පත්තුවේ, කුඩාමඩුව ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු එස්. පී. රණසිංහ විසින් සාදන ලද 2001.08.27 වැනි දිනැති අංක 1164 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන දික්හේන එස්ටේට් හෙවත් දික්හේනේ කනත්ත නමැති ඉඩමේ ලොට් 3 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස එකී අංක 1164 දරන සැලැස්ම අනුව අක්කර පහයි, පර්චස් දහයක් (අ. 5, රූ. 0, පර්. 10) *නොහොත්* හෙක්ටයාර් 2.04872 ක් විශාල ගස්, වගා සහ එහි පිහිටි සියලු දේ සමග ඉඩම. මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එන් 233/268 හි ලියාපදිංචි කර ඇත.

ඉහත සඳහන් දේපළ 2011 ජනවාරි මස 26 වැනි දින පෙරවරු 10.30ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට පිවිසීම.*- කොට්ටාව මංසන්ධියේ සිට මත්තේගොඩ පාර ඔස්සේ ගොස් මත්තේගොඩ මංසන්ධිය දක්වා පැමිණ පොල්ගස්ඕවිට දක්වා යන මාර්ගයට පිවිස කි. මී. 1.5 ක් පමණ ගිය විට දකුණු පසට ඇති කුඩාමඩුව පාර හමුවේ. කුඩාමඩුව පාරේ තවත් මීටර් 500 ක් පමණ ඉදිරියට ගියවිට වම්පසට ඇති වැව වටරවුම පාරට හැරී මීටර් 800 ක් පමණ ගිය විට වරිපනම් අංක 202/97 දරන අදාළ දේපළ පිහිටා ඇත.

*යෝජනා සම්මුති දැන්වීම.*- *රජයේ ගැසට් පත්‍රයේ* 2010.10.21 වැනි දින පළ වී ඇති අතර ලංකාදීප සහ ඩේලිමිරර් පුවත්පත්වල 2010.10.08 වැනි දින ද, තිනකුරල් පුවත්පතේ 2010.10.12 වැනි දින පළ වී ඇත.

*ගෙවීමේ ක්‍රමය.*- සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්), 2. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැණුම් මිලෙන් 1% (සියයට එකක්) වන පළාත් අධිකාරි බද්ද සහ ඒ වෙනුවට රජයෙන් හෝ පළාත් අධිකාරියෙන් පනවනු ලබන වෙනත් ඕනෑම බද්දක්, 3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්), 4. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000, 5. ලිපිකරු සහ සෝෂක වේතන රු. 500, 6. සියලුම ප්‍රචාරක වියදම් ද ගැණුම් මිලෙන් ඉතිරි 90% ද විකිණීමේ දින සිට දින 30 ක් ඇතුළත සෙලාන් බැංකුව පීඑල්සී වෙත ගෙවා නිමකළ යුතුය.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්නඃ සහකාර සාමාන්‍යාධිකාරී (නීති), සොලන් බැංකුව පීඑල්සී, අංක 90, ගාලු පාර, කොළඹ 03, දුරකථන අංක : 011-2456285, 2456283, 2456275.

තුසිත කරුණාරත්න (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු
සහ උසාවි කොමසාරිස්.

ටී. ඇන්ඩ් එච්. ඔක්ෂන්,
අංක 50/3, විහාර මාවත, කොලොන්නාව.
දුරකථන අංක : 011-3068185, 011-2572940.

12-1028

**හැටන් නැෂනල් බැංකුව පීඑල්සී - බොරැල්ල ශාඛාව**

(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හැඳින් වුන)

1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ විකිණීම

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළයේ පල්ලේපත්තුවේ, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ නගර සභා සීමාව තුළ, නාවල පිහිටි නාවල පාරේ වැලිකඩවත්ත ටෙරස් හි වරිපනම් අංක 562/5 දරන, බලයලත් මිනින්දෝරු එම්. ඒ. ජයරත්න විසින් සාදන ලද 2003.04.24 දාතම හා අංක 4057 දරන පිඹුරේ ලොට් 5 ලෙස නිරූපිත, ප්‍රමාණයෙන් අක්. 0, රූඩ් 0, පර්. 20 ක් වූ බෙදා වෙන් කොට සීමා නිර්ණය කළ "බත්මුලකුඹුර" නමැති බිම් කොටස එහි පිහිටි ගොඩනැගිලි සහ සෑම සියලු දේ සමගය.

*ඉඩමට ප්‍රවේශ මාර්ගය.-* කොළඹ කොටුව සිට ශ්‍රී ජයවර්ධනපුර මාවතේ රාජගිරිය දක්වා ගොස් දකුණු පස නාවල පාරට හැරී මීටර් 850 ක් පමණ ගොස් වම් පස වැලිකඩ ටෙරසයට හැරී එම පාර දිගේ පාලමට පෙර රුවන් හාඩ්වෙයාර් ස්ටෝර්ස් අසලින් මීටර් 100 ක් පමණ ගිය විට වම්පස පිහිටි තාවකාලික ගොඩනැගිලි ව්‍යුහයක් සහිත මෙම දේපළ හමුවේ.

සීමාසහිත සොෆ්ට්කොම් සොලුෂන්ස් (පුද්ගලික) සමාගමේ ජයසිංහ ආරච්චිගේ ගාමිණී ජයසිංහ යන අයට සපයන ලද ණය පහසුකම් වෙනුවෙන් ඔහු විසින් බැඳුම්කරු වශයෙන් හැටන් නැෂනල් බැංකුව පීඑල්සී වෙත උකස් තබන ලද ඉහත විස්තර කර ඇති දේපළ 2011 ජනවාරි 18 වැනිදා අඟහරුවාදා පෙ.ව. 10.30 ට ආරම්භව අප විසින් දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2010.09.21 වැනිදා රජයේ *ගැසට් පත්‍රය* ද, 2010.09.17 වැනිදා "දිවයින" "අයිලන්ඩ්" සහ "තිනකරන්" පුවත්පත් ද බලන්න.

*ගෙවීමේ ක්‍රමය.–* මිල තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් ගාස්තු මුදලින් ගෙවිය යුතුය :–

1. ගැණුම් මිලෙන් 10%,
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% (සියයට එකක), දේශීය අළෙවි බද්ද,
3. විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක) වෙන්දේසිකරුගේ කොමිස් මුදල,
4. ලිපිකරුගේ සහ සෝෂකගේ ගාස්තුව රු. 500,
5. විකුණුම් පිරිවැය සහ වෙනත් අයකිරීම් වෙතොත් ඒවා,
6. වෙන්දේසිය සහතික කිරීම සඳහා මුද්දර ගාස්තුව.

ගැණුම් මිලෙන් ඉතිරි 90% ශ්‍රී ලංකා රජය හෝ වෙනත් අධිකාරියක් මගින් පනවන ලද හා අදාළවන අවස්ථාවක ව්‍යවස්ථානුකූල අයබදු, තීරුබදු, බදු හෝ ගාස්තු සමග වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතුය.

හිමිකම් ඔප්පු හා වෙනත් අදාළ ලිපි ලේඛන, කොළඹ 10, ටී. බී. ජයා මාවත, අංක 479, හැටන් නැෂනල් බැංකුව පීඑල්සී හි සහකාර සාමාන්‍යාධිකාරී නැවත අයකර ගැනීම් වෙතින් පරීක්ෂා කර බැලිය හැකිය.

දුරකථන අංකය : 011-2 661816, ෆැක්ස් : 2661835.

ඩලස් කෙලාට් ඔක්ෂන්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ්,
විශේෂඥ වෙන්දේසිකරුවෝ,
තක්සේරුකරුවෝ හා දේපළ වෙළෙන්දෝ,

අංක 146/3, කල්දේරා උයන,
දුටුගැමුණු වීදියෙන් හැරී,
කොහුවල.

දුරකථන අංක : 011-4302622, 011-4302623, ෆැක්ස් : 2856013.

12-1129

---

**නැෂනල් ඩිවලොප්මන්ට් බෑන්ක් පීඑල්සී**

(කලින් නැෂනල් ඩිවලොප්මන්ට් බෑන්ක් ලිමිටඩ්)

1990 අංක 04 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ ජාඇල දඬුගමින් රූඩ් 3යි, පර්. 30ක් විශාලැති අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ දඬුගම ගමෙහි පිහිටි "කජුගහවත්ත කළුතුඹුර සහ හල්ගහඕවිට'' නමැති ඉඩමට 2008 ජනවාරි මස 21 වැනි දින පිළියෙල කරන ලද අංක 5160 දරන පිඹුරේ කැබලි අංක 'ඒ' දරන බෙදා වෙන් කරන ලද ඉඩම සමග එකී ඉඩම සහ පරිශ්‍රය තුළ ගොඩනැගිලි සහ ඒවාට සම්බන්ධ කර හෝ සවිකර ඇති සියලුම නිශ්චල යන්ත්‍ර උපකරණ ඇමුණුම් සමග විදුලි බල පද්ධතිය විදුලි සංදේශ පද්ධතිය සහ ජල සැපයීමේ පද්ධතිය ද වේ.

නැෂනල් ඩිවලොප්මන්ට් බෑන්ක් පීඑල්සී නමින් 2009 මාර්තු මස 26 වැනි දින අංක 222 බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීමට ශ්‍රී වස්තාව එන්ටර්ප්‍රයිසස් හි බාලසුබ්‍රමානියම් අරුණාසලම් සහ ගෝකුළරාම් අරුණාසලම් අය විසින් පැහැර හැර ඇති බැවින් නැෂනල් ඩිවලොප්මන්ට් බෑන්ක් පීඑල්සී විසින් මා වෙත පවරන ලද බලය මත ඉහත කී දේපළ වර්ෂ 2011 ක් වූ ජනවාරි මස 27 වැනි දින පෙරවරු 10.30 ට දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*වැඩිදුර විස්තර සඳහා* 2010.12.10 දින ශ්‍රී ලංකාණ්ඩුවේ *ගැසට් පත්‍රය* ද , 2010.11.24 වැනි දින ද අයිලන්ඩ්, දිවයින සහ තිනකරන් යන පුවත්පත් ද බලන්න.

*දේපළට ප්‍රවිශ්ට වන මාර්ගය.* - කොළඹ සිට පැලියගොඩ දක්වා ගොස් මීගමුව මාර්ගයේ කි. මී. 17 1/2ක් ගමන් කිරීමෙන් මෙම මාර්ගයේ වම් පසින් පිහිටි වරිපනම් අංක 492 ට යාබදව මෙම දේපළ පිහිටා ඇත.

වෙන්දේසිය අවසානයේ දී සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුදල් එවේලේ ම වෙන්දේසිකරු වෙත ගෙවිය යුතුයි:- (1) ගැණුම් මුදලින් 10%ක් ද, (2) පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1%ක් ද, (3) වෙන්දේසිකරුගේ ගාස්තු වශයෙන් 2 1/2%ක් ද, (4) සියලුම ප්‍රචාරක හා වෙන්දේසි වියදම් ද, (5) ලිපිකරු සහ සෝෂක ගාස්තු වශයෙන් රු. 1,500 ක් ද, (6) විකිණීමේ කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු වශයෙන් රු. 2,000ක් ද වේ. ගැණුම් මිලේ ඉතිරි 90% ක මුදල වෙන්දේසි දිනයේ සිට දින 30ක් ඇතුළත ගෙවා අවසන් කළ යුතුයි.

හිමිකම් ඔප්පු සහ අනෙකුත් සියලුම ලියකියවිලි හා විස්තර ලබා ගැනීම සඳහා කොළඹ 02, නවම් මාවතේ අංක 40 දරන ස්ථානයේ නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී හි කළමනාකරු නීති - අයකිරීම් ගෙන් විමසන්න. දුරකථන අංක : 2448448, 2437701. ෆැක්ස් අංකය 2440196.

පී. කේ. ඊ. සේනාපති,
උසාවි කොමසාරිස් තක්සේරුකරු හා
වරලත් වෙන්දේසිකරු.

අංක 134, බැද්දගාන පාර,
කෝට්ටේ.
දුරකථන අංක : 2873656, 0777- 672082, ෆැක්ස් අංකය : 2871184.

12-1125

---

## ලංකා බැංකුව – බොරැල්ල අධිශ්‍රේණි ශාඛාව

ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 22 වැනි වගන්තිය යටතේ වෙන්දේසියේ විකිණීම පිළිබඳ දැන්වීම

ලංකා බැංකු ආඥාපනතේ 19 වැනි වගන්තිය යටතේ ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරනු ලැබ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2010.10.15 දිනැති අංක 1676 දරන *ගැසට් පත්‍රයේ* හා 2010.10.06 දිනැති දිනමිණ, ඩේලිනිව්ස් හා තිනකරන් යන පුවත්පත්වල පළ කරන ලද යෝජනාවකට අනුකූලව එකී ආඥාපනතේ අංක 26 දරන වගන්තිය යටතේ අයකර ගත හැකි මුල් මුදලේ ශේෂය ද, විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අයවිය යුතු පොළිය ද, ගාස්තු හා මුදල් ද අයකරගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපළ සහ පරිශ්‍ර පිහිටි ස්ථානයේ දී ම 2011.02.12 වැනි දින පෙ. ව. 11.30ට කොළොන්නාව, විහාර මාවත, අංක 50/3 හි පදිංචි ටී ඇන්ඩ් එච් ඔක්ෂන්ස් හි වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිමු.

### විකිණීමට ඇති දේපළ

### *උපලේඛනය*

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළයේ , පල්ලේ පත්තුවේ, කැස්බෑව ප්‍රාදේශීය සභා සීමාවේ, මාවිත්තර, පිළියන්දල මහරගම පාරේ, පිහිටි වරිපනම් අංක 110/4ඒ දරන කහටගහවත්ත යනුවෙන් හඳුන්වන ඉඩමේ බලයලත් මිනින්දෝරු එස්. වික්‍රමසිංහ විසින් සාදන ලද 2000 අගෝස්තු මස 21 දිනැති අංක 786/9000 දරන පිඹුරේ ලොට් X4 ලෙස දක්වා බෙදා වෙන් කර ඇති ඉඩම් කැබැල්ල එනම්, එකී ලොට් X4 උතුරට : ලොට් X 3 ද, නැගෙනහිරට : පිණිදියගාර පටුමග ද, දකුණට : පිළියන්දල මහරගම පාර අසල පිනිදියගාර පටුමගේ වරිපනම් අංක 110/2A දරන පරිශ්‍රය ද, බස්නාහිරට : කහරගහවත්ත නමැති ඉඩම ද, මායිම්ව එකී අංක 786/9000 දරන පිඹුර ප්‍රකාර පර්චස් දහතුනයි දශම හතක (අ. 0 රූ. 0 පර්. 13.7) බිම් ප්‍රමාණයකින් යුත් ඉඩම සමග එහි ඇති ගහකොළ වැවිලි, ගොඩනැගිලි ද වේ. මෙය ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 2269/223හි ලියාපදිංචි කර ඇත.

එම්. ජේ. පී. සල්ගාදු,
ජ්‍යෙෂ්ඨ කළමනාකරු.

ලංකා බැංකුව,
බොරැල්ල අධිශ්‍රේණි ශාඛාව.

12-1107

---

## හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - බොරලැස්ගමුව ශාඛාව

1990 අංක 04 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පදිංචියට සුදුසු දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළයේ, උඩුගහ පත්තුවේ, හෝමාගම ප්‍රාදේශීය සභා සීමාව තුළ, මාගම්මන පිහිටි ''හතරඅදහේන'' නමැති ඉඩමට බලයලත් මානක පී. එච්. එම්. එල්. ප්‍රේමචන්ද්‍ර විසින් මැන සාදන ලද අංක 1026 සහ 1990ක් වූ මාර්තු මස 21 වැනි දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද ලොට් ''3 බී'' හි (බලයලත් මානක ඒ. ඊ. සී. ප්‍රනාන්දු විසින් මැන සාදන ලද අංක 2215 සහ 1993 ක් වූ ඔක්තෝබර් මස 29 වැනි දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද ලොට් '3' හි උප බෙදුමක් ලෙස) අක්කර බින්දුවයි රූඩ් බින්දුවයි, පර්චස් දහයක් (අ. 0 රූ. 0 පර්. 10) විශාල ඉඩම (මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එන්. 282/205 හි ලියාපදිංචි කර ඇත) සහ අංක 2215 දරන පිඹුරට අයත් ලොට් '2' හි (අඩි 15ක් පළල පාර) වැඩිදුරටත් විස්තර වන මාර්ග අයිතීන් ද සමග වේ.

මෙම දේපළ ගමගේ අජිත් ධර්මප්‍රිය යන අය ණයකරු හැටියට හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙතින් ලබා ගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් පී. එන්. බී. පෙරේරා විසින් සහතික කරන ලද්දාවූ ද, හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී නමට ලියන ලද්දාවූ ද, 2007.03.15 දින සහ අංක 2957 දරන බැඳුම්කරය යටතේ ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙතින් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින් වර්ෂ 2011 ජනවාරි මස 19 වැනි දින පෙ. ව. 11.30ට දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට පිවිසීම.* – හෝමාගම සිට හොරණ පාරේ මාගම්මන දක්වා කි. මී. 2ක් ගොස් මාගම්මන පාර පසු කර මීටර් කිහිපයක් යන විට අඩි 15ක් පළල පාරට වෙන්කර ඇති ඉඩමේ වම් පැත්තෙන් ප්‍රවේශ වීමට හැකි වන ලෙස මෙම ඉඩම පිහිටා ඇත.

වැඩි විස්තර සඳහා රජයේ ගැසට් පත්‍රයේ වර්ෂ 2010ක් වූ සැප්තැම්බර් මස 17 වැනි දින ද, ද අයිලන්ඩ්, දිවයින සහ තිනකරන් පුවත්පත්වල වර්ෂ 2010ක් වූ සැප්තැම්බර් මස 20 වැනි දින පළ කර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*ගෙවීමේ ක්‍රමය.* - විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු ය :-

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. ප්‍රාදේශීය සභා බදු සඳහා 01% (සියයට එකක්) ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් මුදල 2 1/2% (සියයට දෙකහමාරක්) ද,
4. ලිපිකරු හා සෝෂක වේතනය රු. 500 ක් සහ සියලුම ප්‍රචාරක වියදම් ද,
5. නොතාරිස් ගාස්තු සහ විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000 ක් ද.

ගැණුම් මිලෙන් ඉතිරි 90%ක් වූ (සියයට අනූවක්) විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත දී හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත ගෙවා නිම කළ යුතු වේ. එකී 90% ඉතිරි මුදල දින 30ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති 10% ක මුදල අහිමි කිරීමට සහ එකී දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත. හිමිකම් ඔප්පු සහ වෙනත් අදාළ විස්තර සඳහා විමසන්න. ප්‍රධාන කළමනාකරු (අය කිරීම් අංශය), හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී, අංක 479 ටී. බී. ජයා මාවත, කොළඹ 10. දුරකථන අංක : 011- 2661821 011-2661835.

ඊ. එස්. රාමනායක,
උසාවි කොමසාරිස්, බලයලත් වෙන්දේසිකරු
සහ තක්සේරුකරු, සාම විනිසුරු
(මුළු දිවයිනටම.)

*කාර්යාලය* : අංක 25 'බී' බෙල්මන්ට් වීදිය, කොළඹ 12.
දුරකථන අංක : 011- 5756356, 071- 8760986
ෆැක්ස් අංකය : 011-2334808.

12-1127

---

**සම්පත් බැංකුව පීඑල්සී**

(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

ආර්. ඒ. ඩී. දුෂන්ත,
ගිණුම් අංකය : 1004 5050 5875.

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2010 ජුනි මස 24 වැනි දින සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් දස ලක්ෂ අනූ නම දහස් අටසිය තිස් හතයි ශත තිස් එකක (රු. 10,99,837.31) මුදල ද 2010 අප්‍රේල් 06 දින සිට අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් නම ලක්ෂ හැට නම දහස් නමසිය අනූ හයයි ශත පනස් දෙකක (රු. 9,69,996.52) මුදලක් සඳහා වාර්ෂිකව සියයට විසි එකක් (21%) බැගින් වූ පොලිය ද, දැන්වීම් ගාස්තු ද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදුවූ වෙනත් ගාස්තු ද, තදනන්තරව දරන්නාට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ හා පරිශ්‍රයන් 2010.08.13 දින රජයේ ගැසට් පත්‍රයේ, 2010.08.11 දින "දිවයින", සහ "තිනකුරල්" සහ "අයිලන්ඩ්" දිනපතා ප්‍රවෘත්තිපත්‍රවල පළකොට ඇති පරිදි 2011.01.25 දින ප.ව. 1.30 ට පිහිටි ස්ථානයේ දී මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය යන අය විසින්, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**පළමුවැනි උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළයේ, පල්ලේ පත්තුවේ, කොළඹ මහ නගර සභා සීමාවන් තුළ, වෝඩ් අංක 38 බම්බලපිටියේ, පිහිටි කොල්ලුපිටිය පටුමගේ වරිපනම් අංක බිම් මහල 77/1, 77/16, පළමු මහල 77/17- 77/32, දෙවැනි මහල 77/33 - 77/48, තෙවැනි මහල 77/49- 77/64 දරන, බලයලත් මානක තැන පී. ඩබ්ලිව්. පතිරණ යන අය විසින් සාදන ලද 1982 ජුනි 21 දාතම හා අංක 186 දරන පිඹුරේ නිරූපිත ඒකක 64 කින් සමන්විත කොල්ලුපිටිය ෆ්ලැට්ස් යයි කියනු ලබන ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්- : උතුරට : අබ්දුල් කෆීර් මාවත වරිපනම් අංක 36 සහ 40/1 දරන පරිශ්‍රයන් නැගෙනහිරට : කොල්ලුපිටිය පටුමගේ වරිපනම් අංක 80 සහ 85/1 - 85/7 දරන පරිශ්‍රයන්, දකුණට : කොල්ලුපිටිය පටුමග සහ බස්නාහිරට : කොල්ලුපිටිය පටුමගේ වරිපනම් අංක 71 දරන පරිශ්‍රයන් සහ ආර්. ඒ. ද මෙල් මාවත වරිපනම් අංක 279 දරන පරිශ්‍රයන් යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකයි, පර්චස් විසි අටයි දශම තුනයි අටක් (අක්. 0, රූ. 1, පර්. 28.38) හෝ හෙක්ටයාර 0.17548 ක් විශාල ඉඩම් කොටස සමග සියලුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන්, ප්‍රවශතාවන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 186 දරන පිඹුරට අනුවය.

**දෙවැනි උපලේඛනය**

එකී පිඹුරේ පිටු අංක 06 හි දක්වා ඇති හා CE1 - CE3, CE15 වශයෙන් ලකුණු කොට ඇති පොදු ප්‍රදේශවලට ආසන්නතම පිවිසුමක් සහිත හා පදිංචි නිවෙස් වශයෙන් භාවිත කරනු ලබන හා කොල්ලුපිටියේ ෆ්ලැට්ස් හි තෙවැනි මහලේ පිහිටි එකී වෝඩ් අංක 38 හි බම්බලපිටිය, කොල්ලුපිටිය පටුමගේ වරිපනම් අංක 77/50, දරන 1982 ජුනි 21 දාතම හා අංක 186 දරන එකී තට්ටු නිවාස සංකීර්ණ පිඹුරේ පිටු අංක 06 හි නිරූපිත අංක 50 වශයෙන් ලකුණු කොට ඇති තට්ටු නිවාස සංකීර්ණ ඒකකයට මායිම්- උතුරට : ඒකක අංක 51 න් මෙම ඒකකය වෙන්වන බිත්තියේ මැද, නැගෙනහිරට : CE 12 ඉඩමේ ඉතිරි කොටසේ ඉඩ ප්‍රමාණයෙන් මෙම ඒකකය වෙන් කරන බිත්තියේ මැද, දකුණට : ඒකක අංක 49න් මෙම ඒකකය වෙන්වන බිත්තියේ මැද සහ බස්නාහිරට : CE15 බැල්කනි පිවිසුමෙන් මෙම ඒකකය වෙන්වන බිත්තියේ මැද සහ මුදුන (හිස්) (Zenith), සීලිම සහ නිරීක්ෂකයාගේ හිසට විරුද්ධ දිශාවෙහි (පා පස) අග (Nadir) තුන්වෙනි මහලේ බිම මැද යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් වර්ග අඩි පන්සිය හැටක් (560sq. ft.) විශාල ප්‍රමාණය එකී අංක 186 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව Con A 123/10 යටතේ කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

තෙවැනි උපලේඛනය

පොදු මූලිකාංග :

1. ගොඩනැගිල්ල පිහිටා ඇති ඉඩම.
2. පහල මහල් පිඹුරේ CE12 වශයෙන් ලකුණු කොට ඇති ඉඩමේ ඉතිරි කොටස.
3. මෙම ගොඩනැගිල්ලේ අත්තිවාරම් කණු, මුක්කු, ප්‍රධාන බිත්ති සහ වහල.
4. CE1- CE3 වශයෙන් ලකුණු කොට ඇති බිම් මහලේ, 1 වැනි 2 වැනි සහ 3 වැනි මහල්වල තරප්පුපෙලවල්
5. CE4 සහ CE5 වශයෙන් ලකුණු කොට ඇති ජල කුළුණු (බිම් මහලේ),
6. CE6, CE7 සහ CE8 වශයෙන් ලකුණු කොට ඇති කුණු කසළ කාමරය.
7. CE9 වශයෙන් ලකුණු කොට ඇති පොම්පාගාරය,
8. CE10 වශයෙන් ලකුණු කොට ඇති කාර්යාල කාමරය සහ CE11 වශයෙන් ලකුණු කොට ඇති වැසිකිලිය (Latrine),
9. CE13, CE14, සහ CE15 වශයෙන් පිළිවෙලින් ලකුණු කොට ඇති 1 වැනි, 2 වැනි සහ 3 වැනි මහල් වල බැල්කනි පිවිසුම
10. විදුලිය, දුරකථන, වායුසමීකරණ, ගෑස්, ජලය, මලාපවහන, ජලාපවහන සහ පොදු භාවිතය සඳහා පවත්නා සියලුම උපකරණ (Apparatus) සඳහා වන ස්ථාපිත කිරීම්,
11. එහි පැවැත්මට, නඩත්තුවට සහ ආරක්ෂාවට පහසුකම් සැලසීමටත් හා සාමාන්‍ය පොදු භාවිතයටත් අවශ්‍ය මෙම දේපලේ අනෙකුත් සියලුම අංග සහ පහසුකම්.

පොදු මූලිකාංගයන් හි කොටස සියයට ප්‍රමාණයෙන් 1/64% කි.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

12-1122/1

---

## සම්පත් බැංකුව පීඑල්සී
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

ක්‍රියේටිව් බ්‍රෂ්,
ගිණුම් අංක : 0013 1000 8822.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2010 අප්‍රේල් මස 27 වැනි දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් දහසය ලක්ෂ අසූ හත් දහස් හාරසිය අනූ දෙකයි ශත අනූ පහක (රු.16,87,492.95) මුදල ද 2010 ජනවාරි 20 දින අය විය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් පහලොස් ලක්ෂ තිස් දහස් හාරසියයක (රු.15,30,400) මුදලක් සඳහා වාර්ෂිකව සියයට විසි පහක් (25%) බැගින් වූ පොලිය ද සහ ප්‍රචාරණ වියදම් ද දරන්නට සිදුවූ වෙනත් ගාස්තු ද, තදනන්තරව දරන්නට සිදුවූ යම් මුදලක් වෙතොත් ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ හා පරිශ්‍රයන් 2010.06.11 දින රජයේ *ගැසට් පත්‍රයේ*, 2010.06.02 දින "දිවයින", "අයිලන්ඩ්" සහ "තිනකුරල්" දිනපතා ප්‍රවෘත්ති පත්‍රවල පළකොට ඇති පරිදි 2011.01.25 දින ප.ව. 3.30 ට පිහිටි ස්ථානයේ දී මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය යන අය විසින්, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ අධිකාරි පත්තුවේ, කැළණිය ප්‍රාදේශීය සභා සීමාවන් තුළ, කැළණිය පොල්හේන පිහිටි මනිගමුල්ල වරිපනම් අංක 258 දරන "මිල්ලගහවත්ත සහ හිග්ගහවත්ත" යැයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඩබ්ලිව්. බී. එල්. ප්‍රනාන්දු යන අය විසින් සාදන ලද 2006 දෙසැම්බර් මස 06 දාතම හා අංක 7335 දරන පිඹුරේ නිරූපිත බෙදාවෙන්කොට සීමා නිර්ණයකොට ලොට් 4 බී - වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම් උතුරට: අංක 5528 දරන පිඹුරේ ලොට් 4 ඒ, නැගෙනහිරට : ඒ. කේ. පෙරේරා යන අයගේ උරුමක්කාරයන් විසින් හිමිකම් කියනු ලබන කුඹුර දකුණට : ලොට් 4 බී 2 සහ අංක 6203 දරන පිඹුරේ ලොට් 4 බී හි ඉතිරි කොටස සහ ලොට් 4 බී සහ බස්නාහිරට ලොට් 4 බී 2 සහ 6203 දරන පිඹුරේ ලොට් 4 බී හි ඉතිරි කොටස යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් විස්සයි දශම පහයි බිංදුවක් (අක්. 0, රූ. 0, පර්. 20.50) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන්, ප්‍රවශතාවන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 7335 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව C704/210 යටතේ කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

(අඩි 12 පළල පාර), බලයලත් මානකතැන ආර්. හෙට්ටිආරච්චි යන අය විසින් සාදන ලද 1986 මැයි 04 දාතම හා අංක 70/1986 දරන පිඹුරේ ලොට් 1 සහ 2 සහ 2003 ජූලි 10 දාතම හා අංක 5401 දරන පිඹුරේ ලොට් එක්ස්, 2004 දෙසැම්බර් 15 දාතම හා අංක 6203 දරන පිඹුරේ ලොට් 4 සී, එකී අංක 7335 දරන පිඹුරේ ලොට් 4 බී 2 (අඩි 12 පළල පාර) මතින් ගමන් කිරීමේ හා මාර්ග අයිතිය ද සමගය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

12-1122/2

---

## සම්පත් බැංකුව පීඑල්සී
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

එස්. එස්. ප්‍රේමවතී නොහොත් ආර්. එස්. ප්‍රේමවතී සහ එච්. ජී. යූ. ප්‍රියන්ත,
ගිණුම් අංකය : 1014 5341 2770.

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2010 ජූනි මස 24 වැනි දින සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ

මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් දහ නම ලක්ෂ අසූ හත් දහස් අටසිය හැට හතරයි ශත හැට අටක (රු. 19,87,864.68) මුදල ද 2010 අප්‍රේල් 16 දින සිට අයවිය යුතු මුදල පියවනු ලබන දිනය තෙක් රුපියල් දහ අට ලක්ෂ විසිහත් දහස් පන්සිය අනුවයි ශත හැටක (රු. 18,27,590.60) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහ අටක් (18%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදුවූ වෙනත් ගාස්තු ද, තදනන්තරව දරන්නට සිදුවූ යම් මුදලක් වෙතොත් ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ හා පරිශ්‍රයන් 2010.08.13 වැනි දින රජයේ ගැසට් පත්‍රයේ, 2010.08.10 දින "දිවයින", සහ "තිනකුරල්" සහ "අයිලන්ඩ්" දිනපතා ප්‍රවෘත්ති පත්‍ර වල පළකොට ඇති පරිදි 2011.01.18 දින පෙ.ව. 9.00 ට පිහිටි ස්ථානයේ දී මහනුවර බලයලත් වෙන්දේසිකරු වන අයි. ඩබ්ලිව්. ජයසූරිය යන අය විසින්, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, බස්නාහිර මොරවක් කෝරළයේ හොරගල පිහිටි "ඉලුක්තැන්න නොහොත් බෙරළුවහේන" යැයි කියනු ලබන ඉඩමට සර්වේයර් ජෙනරාල් විසින් සාදන ලද 1970 අගෝස්තු 12 දාතම හා අංක F. V. P. අංක 16 හි නිරූපිත බෙදාවෙන්කොට සීමා නිර්ණය කොට ලොට් 372 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : F. V. P. අංක 16 හි ලොට් $27^{AN}$, නැගෙනහිරට : F. V. P. අංක 16 හි ලොට් $27^{B}$ දකුණට : F. V. P. අංක 16 හි ලොට් 373 සහ බස්නාහිරට F. V. P. අංක 16 හි ලොට් $27^{E}$ යන මායිම් තුල පිහිටි ප්‍රමාණයෙන් අක්කර එකයි, පර්චස් විසි අටක් (අක්. 1, රූ. 0, පර්. 28) විශාල ඉඩම් කොටස සමග සම්පූර්ණයෙන් පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග සියලුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන්ද, වරප්‍රසාදයන්, ප්‍රවශතාවන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග වෙළුම/පත්ඉරුව LDO reference බ 18/01 යටතේ මොරවක ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

එකී ලොට් 372 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටස, බලයලත් මානකතැන අයි. කොටඹගේ යන අය විසින් සාදන ලද 2007 අගෝස්තු 08 දාතම හා අංක 221 දරන පිඹුරේ නිරූපිත ලොට් 372 වශයෙන් දැන් ලකුණු කොට ඇති අතර එහි හා නැවත මිනුමකි.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

12-1122/3

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.